# 1. 1995 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු සහ ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ

සාමාන්‍ය වශයෙන් ඉහළ ආර්ථික වර්ධනය, අඩු උද්ධමන වේගය, රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවයෙහි සැලකිය යුතු අඩුවීම සහ ගෙවුම් ශේෂයේ සමස්ත හිඟය යළි උද්ගතවීම 1995 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි දක්නට ලැබුණු සුවිශේෂ ලක්ෂණ වේ. වඩා වේගවත් ආර්ථික සංවර්ධනයකට, මිල ස්ථායිතාවයට හා ආර්ථිකයේ විදේශ අංශයෙහි ශක්තිමත්භාවයට අනුකූල වන ලෙස ව්‍යුහාත්මක දුර්වලතාවයන් නිවැරැදි කිරීම හා අයවැය හිඟය අඩු කිරීම සඳහා වන මධ්‍යකාලීන සැලසුමක් කෙරෙහි රජයේ ඇති කැපවීම, 1995 වර්ෂය සඳහා අයවැය ලේඛනය මගින් ද, වෙනත් ප්‍රතිපත්ති ප්‍රකාශන මගින් ද යළි තහවුරු කරන ලදී. මෙම අරමුණු ළඟා කර ගැනීමේ ප්‍රයත්නයේ සැලකිය යුතු ප්‍රගතියක්, විශේෂයෙන් ම තීරුබදු ප්‍රතිසංස්කරණය සහ පෞද්ගලීකරණ යන ක්ෂේත්‍රවල, 1995 දී අත්කරගනු ලැබීය. 1994 හා සැසඳීමේ දී අයවැය ලේඛනයේ වර්තන ගිණුමේ හිඟය සහ සමස්ත හිඟය ද සැලකිය යුතු පරිදි අඩු විය. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය අංශයෙහි අත්කර ගත් ප්‍රතිඵල, 1995 අයවැය ඉලක්කයන් හා සසඳන විට ප්‍රමාණවත් නොවිය. ඉහළ යමින් පැවැති ආරක්ෂක වියදම් පියවා ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත්වලින් විශාල ප්‍රමාණයක් අවශ්‍ය විය. තිරිඟු පිටි සඳහා පැවැති අධික ජාත්‍යන්තර මිල හේතුවෙන් තිරිඟු පිටි සහනාධාරය, අයවැය මත අතිරේක බරක් වූයේ සම්පත් බෙදීයාම සහ දේශීය කෘෂිකර්මය කෙරෙහි එමගින් ඇති වූ අහිතකර ප්‍රතිවිපාක වලට අමතරවය. 1995 දී ආදායම් වැඩි කිරීමේ සහ වියදම් විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදී තිබියදීත්, රාජ්‍ය මූල්‍ය ගැලපුමකට අවහිර කළ රාජ්‍ය අංශයේ වැටුප් හා විශ්‍රාම වැටුප් සම්බන්ධ වූ අනම්‍ය පිරිවැය සහ රාජ්‍ය ණය පොලී ගෙවීම් නිසා ඇති වූ ව්‍යුහාත්මක දුර්වලතා දක්නට ලැබුණි. මේ නිසා කෙටිකාලයේදී රාජ්‍ය මූල්‍ය ගැලපීම් කිරීම අසීරුවිය. එහෙයින් 1995 අයවැයෙන් අපේක්ෂිත පරිදි ජංගම ගිණුමේ අතිරික්තයක් හෝ රජය විසින් ශුද්ධ වශයෙන් බැංකු ණය ආපසු ගෙවීමක් ළඟාකරගත නොහැකි විය. නොකඩවා ඉහළ මට්ටමක පැවැති මූල්‍ය වර්ධනයට දායක වෙමින් රාජ්‍ය මූල්‍ය කටයුතු ප්‍රසාරණය විය.

විදේශීය අංශය පිළිබඳව සලකා බැලීමේ දී අපනයන ක්‍රියාකාරිත්වය යහපත් වූ නමුත් විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලාඒම සැලකිය යුතු පරිදි පහත වැටීම, ගෙවුම් ශේෂයේ සමස්ත හිඟයක් ඇති වීමටත්, විනිමය අනුපාතිකයෙහි වේගවත් පිරිහීමටත් හේතුවිය. මේ අතර, ඉහළ ගිය මූර්ත ආදායම් මට්ටම සහ ධන මූර්ත පොලී අනුපාත සමග වාණිජ බැංකු විසින් ඉතිරිකිරීම් ඒකරාශි කිරීම සඳහා දැරූ දැඩි තරගකාරී ප්‍රයත්නයන් හේතුකොට ගෙන දේශීය ඉතිරිකිරීම් වැඩි විය. කෙසේ වුවද, අභ්‍යන්තර ආරක්ෂක තත්ත්වය පිළිබඳ අවිනිශ්චිත ස්වභාවයත්, කම්කරු අසහනය සහ මෙක්සිකානු අර්බුදයේ අතුරු ප්‍රතිවිපාක වශයෙන් ලෝක ප්‍රාග්ධන සහ විනිමය වෙළඳපොළවල ඇතිවූ දැඩි විචලතාවයද හේතුකොට ගෙන පෞද්ගලික ආයෝජන පහත මට්ටමක පැවැතුනි.

## 1.2 මූර්ත අංශයේ වර්ධනයන්

### ආර්ථික වර්ධනය

දළ දේශීය නිෂ්පාදිතයේ මූර්ත වර්ධනයෙන් දැක්වෙන පරිදි, ශ්‍රී ලංකා ආර්ථිකය 1995 දී සියයට 5.5 කින් වර්ධනය විය. ඒ අනුව පසුගිය අවුරුදු කිහිපයේ දී ආර්ථික කටයුතු ප්‍රගාමීව නිදහස් කිරීම සමඟ ඇති වූ වර්ධන වේගය තවදුරටත් පවත්වා ගත

**සංඛ්‍යා සටහන 1.1**

**ජාතික ආදායම් සංඛ්‍යා 1993 - 1995**

| ශීර්ෂය | වටිනාකම රුපියල් දශලක්ෂ | | | වර්ධන අනුපාතිකය ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | 1993* | 1994* | 1995* | 1994* | 1995* |
| 1. පවත්නා සාධක වියදම් මිල අනුව ද. දේ. නි. | 453,092 | 523,300 | 598,327 | 15.5 | 14.3 |
| 2. ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව ද. දේ. නි. | 150,783 | 159,269 | 167,953 | 5.6 | 5.5 |
| 3. පවත්නා සාධක වියදම් මිල අනුව ද. ජා. නි. | 447,113 | 514,990 | 591,245 | 15.2 | 14.8 |
| 4 ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව ද. ජා. නි. | 148,744 | 156,571 | 165,860 | 5.3 | 5.9 |
| 5. පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද. ජා. නි. | 499,622 | 575,528 | 658,503 | 15.2 | 14.4 |
| 6. පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද. දේ. නි. | 499,760 | 579,147 | 661,902 | 5.9 | 14.3 |
| 7. මැදි වසර ජනගහනය (`000) | 17,619 | 17,865 | 18,112 | 1.4 | 1.4 |
| 8. ඒක පුද්ගල ද. ජා. නි. | | | | | |
| පවත්නා සාධක වියදම් මිල අනුව (රු.) | 25,377 | 28,827 | 32,644 | 13.6 | 13.2 |
| ස්ථාවර සාධක වියදම් මිල අනුව (රු.) | 8,442 | 8,764 | 9,157 | 3.8 | 4.5 |
| පවත්නා වෙළෙඳ පොළ මිල අනුව (රු.) | 28,357 | 32,215 | 36,357 | 13.6 | 12.9 |
| 9. පවත්නා වෙළෙඳ පොළ මිල අනුව ඒක පුද්ගල ද. දේ. නි. (රු.) | 28,365 | 32,418 | 36,545 | 14.3 | 12.7 |

* තාවකාලික


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

හැකි විය. විවෘත හා වෙළෙඳපොළ හිතවාදී ආර්ථික ප්‍රතිපත්ති වාතාවරණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වූ ප්‍රතිසංස්කරණ නොකඩවා ක්‍රියාත්මක කරගෙන යාම, ප්‍රබල අපනයන ක්‍රියාකාරිත්වය, ප්‍රාථමික භාණ්ඩ මිල ඉහළ යාම සහ යහපත් කාලගුණික තත්ත්වයන් ද මෙම සාමාන්‍යයෙන් ඉහළ ආර්ථික වර්ධනය සඳහා උපකාරී විය. ඉකුත් පස් වසරේ වාර්ෂික සාමාන්‍ය වර්ධන වේගය සියයට 5.5 ක් විය.

නාමික දළ දේශීය නිෂ්පාදිතය සියයට 14 කින් වර්ධනය වීමත් සමඟම, 1994 දී රුපියල් 32,418 ක්වූ ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම, (එක්සත් ජනපද ඩොලර් - එ.ජ.ඩො. 656) 1995 දී රුපියල් 36,545 (එ.ජ.ඩො. 713) දක්වා වැඩි විය. මෙම ඒකපුද්ගල ආදායම, දකුණු ආසියානු රටවල් අතර ඉහළම අගය වුවත්, කාර්මික රටවල සහ වේගයෙන් වර්ධනය වන ආසියාතික රටවල ඒකපුද්ගල ආදායම්වලට වඩා විශාල වශයෙන් අඩු අගයකි. දශක පහකට පෙර ශ්‍රී ලංකාව සාපේක්ෂ වශයෙන් ආසියාවේ ඉහළ ආදායම් ඇති රටවල් අතර සිටි නමුත් පසුව ශ්‍රී ලංකාව ආර්ථික ප්‍රගතිය අතින් එම රටවලට පසුපසින් සිටින තත්ත්වයකට පත්විය. මෑත කාලීන ආර්ථික වර්ධනයන් දිරිගන්වන සුළු වුවත් සෙසු ලෝකය සමග ඉදිරියට යාමට නම් වඩා හොඳ ආර්ථික ප්‍රගතියක් ළඟා කරගත යුතුය. කෙසේ වුවද, ආර්ථික ක්‍රියාකාරිත්වයේ මෑත කාලීන වර්ධනය වුවද අත්කර ගත්තේ රටෙහි එක් කොටසක දිග් ගැසෙමින් . පැවැති ආයුධ සන්නද්ධ ගැටුමක් තිබියදී බව සඳහන් කළ යුතුය.

ආයෝජන ආදායම් ගලායෑම සඳහා දළ දේශීය නිෂ්පාදිතය ගැලපූ විට, දළ ජාතික නිෂ්පාදිතය 1995 දී සියයට 5.9 කින් වර්ධනය විය. මෙය සියයට 1.4 ක් වූ ජනගහන වර්ධනයට ගැලපූ කල ලැබෙන ඒකපුද්ගල මූර්ත ආදායම 1995 දී සියයට 4.5 කින් ඉහළ නැගුණි.

සියයට 31 කින් දායක වෙමින් කාර්මික



රූප සටහන 1.1
මූර්ත නිෂ්පාදිතයේ වර්ධන අනුපාත

නිෂ්පාදන අංශය 1995 ආර්ථික වර්ධනයේ පෙරමුණ ගත්තේය. වර්ධනයට දායකත්වය සැපයූ අනෙකුත් ප්‍රධාන අංශයන් වූයේ වෙළෙඳ අංශය (සියයට 13 ක්), කෘෂිකාර්මික (සියයට 12 ක්), ප්‍රවාහන හා සන්නිවේදන (සියයට 11 ක්) සහ මූල්‍ය අංශය (සියයට 10 ක්) වශයෙනි. වේගවත්ම වර්ධනයන් පෙන්වූ අංශ වූයේ මූල්‍ය සේවා (සියයට 11 කින්), විදුලිබලය, ගෑස් හා ජලය (සියයට 10 කින්) සහ නිෂ්පාදන කර්මාන්ත (සියයට 9 කින්) යන අංශයන්ය. කෘෂි අංශය සියයට 3 ක සාමාන්‍ය වර්ධනයක් වාර්තා කළේය.

කලකට පෙර කෘෂිකාර්මික අංශය ඉතා වැදගත් ස්ථානයක් දැරූ ශ්‍රී ලංකා ආර්ථිකය, නොකඩවා විවිධාංගීකරණයවීමේ ලක්ෂණ පෙන්විය. දළ ජාතික නිෂ්පාදිතයෙහි සියයට 22 ක කොටසක් දැරූ තොග හා සිල්ලර වෙළෙඳ අංශය යන්තමින් කාර්මික නිෂ්පාදන අංශයට ඉදිරියෙන් සිටිමින් ප්‍රධාන අංශය ලෙස පැවැතිය ද සියයට 21 ක කොටසක් දැරූ කාර්මික නිෂ්පාදන අංශය ප්‍රථමවරට සියයට 20 ක කොටසක් දැරූ කෘෂිකර්මාන්ත අංශය ඉක්මවිය.

## කෘෂිකර්මය

වන සම්පත් හා ධීවර ඇතුළු සමස්ත කෘෂිකර්ම අංශය පසුගිය වසරේ පෙන්වූ වර්ධනයට බොහෝදුරට සමාන වූ සියයට 3.3 ක මූර්ත වර්ධනයක් වාර්තා කළ අතර අනෙකුත් සියලුම අංශ සමස්ත වශයෙන් සියයට 6 කින් වර්ධනය විය. 1960 දශකය මුලදී දළ දේශීය නිෂ්පාදිතයෙහි කෘෂිකර්මයට හිමි වූ කොටස සියයට 40 ක් පමණ විය. 1990 දී එය සියයට 23 දක්වා ද, 1994 දී සියයට 20 දක්වා ද තවදුරටත් පහත වැටුණි. ආර්ථික වර්ධනය සඳහා කෘෂිකාර්මික අංශයෙහි දායකත්වය 1994 දී පැවැති සියයට 13 සිට 1995 දී සියයට 11 දක්වා අඩු විය.

කලක් ආර්ථිකයෙහි ප්‍රමුඛ ස්ථානය දැරූ ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අංශය, දිගු කාලයක් තිස්සේ කඩින්කඩ අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දුනි. ඉඩම් ප්‍රතිසංස්කරණයත් සමග වතු, රජයේ අයිතිය යටතට පත් වූ පසු, වැඩි වැටුප් පිරිවැය, පහත් ඵලදාව හා පහත් ඵලදායිතාව වැනි ප්‍රශ්න හේතුවෙන් තවදුරටත් බැරෑරුම් තත්ත්වයට පත්විය. වැවිලි කළමනාකරණයට කෙරුණු රජයේ මැදිහත්වීම් වලදී සැලකිල්ලට ගැනුනේ වාණිජමය කරුණුවලට වඩා සමාජ හා දේශපාලන කරුණුය. එහෙයින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ වැවිලි කළමනාකරණය, විශාල මූල්‍යමය පාඩු, පිරිවැය ඉහළ යාම හා කාර්යක්ෂමතාවය පහත වැටීම යන ලක්ෂණයන්ගෙන් යුක්ත විය. මෙයට පිළියමක් වශයෙන්, රජය 1992 දී ප්‍රතිව්‍යූහගත කිරීමේ වැඩපිළිවෙලක් ඇරඹීමට තීරණය කළ අතර, පස් අවුරුදු කොන්ත්‍රාත් මත, රාජ්‍ය වතු විශාලවන්ගෙන් වැඩි ප්‍රමාණයක් පෞද්ගලික කළමනාකරණ සමාගම්වලට පවරා දෙනු ලැබිය. කෙසේ වුවද, කෙටිකාලීන ස්වරූපයක් දැරූ මෙම කොන්ත්‍රාත්තු වැඩපිළිවෙල, දිගුකාලීන ප්‍රතිඵල ලබා දෙන නව ආයෝජන සහ වැඩිදියුණු කිරීම් වෙනුවෙන් පෞද්ගලික කළමනාකරුවන් දිරිගැන්වූයේ සුළු වශයෙනි. මේ නිසා, රජය 1995 වර්ෂයේ දී, බදුකරය දීර්ඝ කිරීමේ හැකියාව ද සහිතව, රාජ්‍ය වතුවල කළමනාකරණය අවුරුදු 50 ක කාලයක් සඳහා පෞද්ගලිකරණය කිරීමට තීරණය කළේය.


තේ, රබර් සහ පොල් යන අංශවල එකතු වූ වටිනාකම් පිළිවෙලින් සියයට 1.6 කින්, සියයට 0.9 කින් හා සියයට 5.1 කින් වැඩි වූ බවට ඇස්තමේන්තු කර ඇත. තේ අපනයන මිලෙහි සියයට 12 ක වැඩිවීමට අනුරූපව කොළඹ වෙන්දේසියෙහි තේ මිල ගණන් ද 1995 දී, කිලෝග්‍රෑමයකට රුපියල් 65.12 හි සිට කිලෝග්‍රෑමයකට රුපියල් 72.21 දක්වා වැඩි විය. විශේෂයෙන්ම සෝවියට් ක්‍රමයෙන් ස්වාධීන වූ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල ඉල්ලුම වැඩිවීම සහ දේශීය පරිභෝජනය ඉහළ යෑම හේතුකොට ගෙන ඉන්දියාවේ අපනයනය කළ හැකි අතිරික්ත තේ ප්‍රමාණය අඩුවීම ද හේතුවෙන් ලෝක තේ ඉල්ලුම වැඩිවීම මින් පිළිබිඹු වේ. 1995 වර්ෂයේ තේ නිෂ්පාදනය, ඊට පෙර වර්ෂයෙහි වාර්තා වූ උපරිම නිෂ්පාදනය සියයට 2 කින් ඉක්මවමින් කිලෝග්‍රෑම් දශලක්ෂ 246 දක්වා වැඩි විය. හිතකර කාලගුණික තත්ත්වය මෙයට බොහෝදුරට හේතු විය. සමහර රාජ්‍ය වතුවල වඩාත් කාර්යක්ෂම වූ වැඩිදියුණු කරන ලද කළමනාකාරිත්වය සහ කුඩා වතු හිමියන්ගේ ඉහළ ඵලදායකත්වය මෙන්ම ආකර්ශණීය මිල ගණන් ද මෙම වර්ධනයට දායක විය.

ස්වභාවික රබර් සඳහා ලෝක ඉල්ලුම වැඩිවීම සහ ලෝකයේ රබර් තොග පහත වැටීම හේතුකොට ගෙන 1995 වසර තුළ රබර් සඳහා ඉතා ඉහළ මිල ගණන් දක්නට ලැබිණ. දිගු කාලයක් තුළ රබර් සඳහා ලැබුණු අඩු මිල ගණන් හේතුවෙන් රබර් නිෂ්පාදනය වැඩි නොවී පැවැතීම නිසා ශ්‍රී ලංකාවේ රබර් වගාකරුවන්ට මෙම ප්‍රතිලාභ මුළුමණින් ම අත්කර ගැනීමට නොහැකි විය. කම්කරු හිඟය නිසා ද මෙම අංශය දිගින් දිගටම ගැටළුවලට මුහුණ පෑවේය. කිරි කැපීම යටතේ ඇති වගා බිම් ප්‍රමාණයෙන් සියයට 60 කට වඩා වැඩි ප්‍රමාණයක් පෞද්ගලික අංශය සතුව පවත්නා රබර් වගාව ප්‍රධාන වශයෙන් ම කුඩා වතු හිමියන්ගේ වගාවක් වේ. කුඩා රබර් වතු අංශයේ සාමාන්‍ය පිරිවැය සියයට 6 කින් ඉහළ ගිය අතර, ඉහළ ශ්‍රම පිරිවැය හා ඉහළ පොහොර හා අනිකුත් යෙදවුම් පිරිවැය පිළිබිඹු කරමින් එය විශාල වතුවල සියයට 32 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 1995 වර්ෂයේ වැඩි වූ මිල ගණන්, වැඩිදියුණු කළ රබර් වර්ග නැවත වගා කිරීම සඳහා යම් දිරි ගැන්වීමක් කළේය. කෙසේ වුවද කුඩා රබර් වතු පුනරුත්ථාපන වැඩසටහනේ දැනට අත්කරගෙන ඇති සියයට 50 ක් පමණ වන ප්‍රගතිය මගින් පෙන්වන්නේ රබර් වගා අංශයේ පවතින මන්දගාමී බවයි. මේ අතර, දේශීය රබර් පරිභෝජනය වැඩි වෙමින් පවතිනුයේ රබර් පදනම් කරගත් දේශීය කර්මාන්තවල වර්ධනය පිළිබිඹු කරමිනි.

1986 ට පසුව ඉහළම ඵලදාවක් සනිටුහන් කරමින් 1995 වර්ෂයේ දී පොල් නිෂ්පාදනය, ඉකුත් වර්ෂයෙහි නිෂ්පාදනය සියයට 5 කින් ඉක්මවූයේ 1994 දී වාර්තා වූ සියයට 21 ක වර්ධනයට පසුවය. ඉකුත් වර්ෂ දෙක තුළ පැවැති හිතකර කාලගුණික තත්ත්වයෙහි පසුකාලීන බලපෑම හා පොහොර භාවිතයේ වැඩිවීම නිෂ්පාදනයෙහි වර්ධනයට හේතු විය. පොල් වගාවේ සාමාන්‍ය ඵලදාව සියයට 5 කින් වැඩි විය. සැපයුම වැඩිවීම හේතුකොට ගෙන, ශ්‍රී ලාංකිකයන්ගේ දෛනික

**රූප සටහන 1.2**

**ද. දේ. නි. හි ආංශික සංයුතිය**



සංඛ්‍යා සටහන 1.2

## දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධන අනුපාතික 1993 - 1995 ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව

| ශීර්ෂය | වටිනාකම් රුපියල් දශලක්ෂ | | | වර්ධන අනුපාතිකය සියයට | |
|---|---|---|---|---|---|
| | 1993* | 1994* | 1995* | 1994* | 1995* |
| 1 කෘෂිකර්මය, වන හා ධීවර | 31,554 | 32,593 | 33,659 | 3.3 | 3.3 |
| තේ | 2,985 | 3,116 | 3,166 | 4.4 | 1.6 |
| රබර් | 681 | 688 | 694 | 1.0 | 0.9 |
| පොල් | 2,799 | 3,376 | 3,548 | 20.6 | 5.1 |
| වී | 6,447 | 6,750 | 7,067 | 4.7 | 4.7 |
| අනෙකුත් කෘෂිකර්ම, වන හා ධීවර | 18,642 | 18,663 | 19,184 | 0.1 | 2.8 |
| 2. පතල් හා කැනීම් | 3,693 | 3,915 | 4,048 | 6.0 | 3.4 |
| 3. නිමැවුම් කර්මාන්ත | 28,806 | 31,418 | 34,294 | 9.1 | 9.2 |
| තේ, රබර් හා පොල් මද නිෂ්පාදන සැකසීම් | 3,157 | 3,567 | 3,724 | 13.0 | 4.4 |
| අනෙකුත් | 25,649 | 27,851 | 30,570 | 8.6 | 9.8 |
| 4. ඉදිකිරීම් | 10,400 | 11,024 | 11,564 | 6.0 | 4.9 |
| 5. සේවා | 76,330 | 80,319 | 84,388 | 5.2 | 5.1 |
| 6. ද. දේ. නි. | 150,783 | 159,269 | 167,953 | 5.6 | 5.5 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදායම | -2,039 | -2,698 | -2,093 | - | - |
| 8. ද. ජා. නි. | 148,744 | 156,571 | 165,860 | 5.3 | 5.9 |

* තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආහාරයෙහි ප්‍රධාන තැනක් ගන්නා පොල්වල, සාමාන්‍ය දේශීය මිල 1995 දී සුළු වශයෙන් පහත වැටුණි. අනෙකුත් වගාවන්හිදී මෙන්ම, වැටුප් ඉහළ නැගීම හා පොහොර මිල වැඩිවීම හේතුකොටගෙන 1995 වර්ෂයේ දී පොල් ගෙඩියක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය, රුපියල් 1.97 දක්වා සියයට 7 කින් වැඩි විය. නාගරික ප්‍රදේශ ආසන්නයේ ඇති පොල් වගා බිම් නේවාසික ප්‍රදේශ බවට පරිවර්තනය වුවද පොල් වගාව යටතේ ඇති මුළු බිම් ප්‍රමාණය වැඩි විය. මේ අතර, වර්ෂය තුළ දී නැවත වගාව හා අතුරු වගාව යටතේ වූ පොල් ඉඩම් ප්‍රමාණය ද සැලකිය යුතු වර්ධනයක් පෙන්විය.

අනෙකුත් අපනයන බෝග අංශයෙහි මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබිණ. කුරුඳු, පැහිරි, සාදික්කා හා වසාවාසි වැනි බෝගයන්හි වර්ධනයක් වාර්තා වූ අතර කෝපි, ගම්මිරිස්, කරාබුනැටි හා කරදමුංගු යන මේවායේ පහත වැටීමක් පෙන්විය.

මේ අතර, වර්ෂය තුළ දේශීය වෙළෙඳපොළ පදනම් කරගත් කෘෂිකාර්මික අංශයෙහි යහපත් ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබිණි. සහනාධාරය හේතුකොට ගෙන අඩු මිලට තිරිඟු පිටි සැපයුනද හිතකර කාලගුණික තත්ත්වය හා පොහොර භාවිතය වැඩිවීම හේතුකොට ගෙන වී නිෂ්පදානය සියයට 5 කින් ඉහළ ගියේය. 1994/95 මහ කන්නයේ වී අස්වැන්න ඉකුත් මහ කන්නයෙහි නිෂ්පාදනය සියයට 5 කින් අභිබවා යමින් මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.76 ක් වූ බව ඇස්තමේන්තු කර ඇත. 1995 යල කන්නයේ වී අස්වැන්න මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.05 දක්වා සියයට 3 කින් වැඩි විය. අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණයෙහි ඉහළ යෑම හා ඵලදාවේ වැඩිවීම මෙම වර්ධනයට දායක විය. 1995 වර්ෂයෙහි සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,535 දක්වා සියයට 5 ක වර්ධනයක් වාර්තා කළේය. පොහොර භාවිතය සියයට 17 කින් ඉහළ යෑම සහ පහසුවෙන් ණය ලබාගත හැකිවීම මෙයට බලපෑවේය. 1994/95 මහ කන්නය තුළ දී, දෙන ලද කෘෂි ණය ප්‍රමාණය ඊට පෙර මහ කන්නයට වඩා සියයට 26 කින් වැඩි විය. එසේම, 1995 යල කන්නය තුළ දෙන ලද කෘෂි ණය ප්‍රමාණය ද සියයට 14 කින් වැඩි විය.

වාර්තාගත වී අස්වැන්න හා සහන මිල යටතේ තිරිඟු පිටි ලබාගත හැකිවීම නිසා විවෘත වෙළෙඳපොළෙහි වී මිල පහත වැටුණු හෙයින්, සහතික මිල යටතේ වී මිලදී ගැනීම පිණිස බැංකු ක්‍රමයෙන් ණය පහසුකම් ද සපයමින්, වී අලෙවි මණ්ඩලය යළි ක්‍රියාකාරී තත්ත්වයකට පත් කරන ලදී. 1994 වර්ෂය තුළ, වී අලෙවි මණ්ඩලය විසින් මිල දී ගත් මෙට්‍රික් ටොන් 1,20,000 ට සාපේක්ෂව 1995 වර්ෂය තුළ වී මෙට්‍රික් ටොන් 2,82,000 ක් මිල දී ගෙන ඇත. 1995 දී වී අලෙවි මණ්ඩලයේ මිලදී ගැනීම් මුළු වී නිෂ්පාදනයෙන් සියයට 10 ක් පමණ වූ අතර, වී වෙළෙඳපොළ කෙරෙහි සුළු බලපෑමක් කරන්නට ඇත. එබැවින්, 1995 අග භාගයේ දී තිරිඟු පිටි සහනාධාරය අඩු කිරීම, ගොවියා සඳහා මිල සාධුබලයන් නැවත ඇති කිරීම පිළිබඳව වූ යහපත් වෙනසකි.

1995 දී, සීනි නිෂ්පාදනයෙහි සුළු අඩුවීමක් වාර්තා විය. මිරිස්, ළූණු, අර්තාපල්, බඩ ඉරිඟු සහ කුරක්කන් වැනි විවිධ බෝගයන්ගෙන් සමන්විත ආහාර බෝග අංශයේ නිෂ්පාදනයෙහි මිශ්‍ර ක්‍රියාකාරීත්වයක්

දක්නට ලැබුණි. වගා ඇස්තමේන්තුවලට අනුව, අර්තාපල්, සෝයාබෝංචි සහ තල නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඵලදාව මෙන්ම වගා කළ බිම් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන්ද අර්තාපල් නිෂ්පාදනය සියයට 40 කට වඩා වැඩි වූ බව ඇස්තමේන්තු කර ඇත. අනෙක් අතට, 1995 දී ලොකු ළූණු නිෂ්පාදනය තියුණු ලෙස අඩු වී යැයි ඇස්තමේන්තු කර ඇත. විශේෂයෙන් ම 1994 වර්ෂයේ අතිවිශාල නිෂ්පාදනය අලෙවි කර ගැනීමේ දී ගොවින් මුහුණ පෑ ගැටළු, ළූණු වගා කිරීම අධෛර්යමත් කිරීමට හේතු විය.

මුහුදු සහ ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනයේ සහ ඉස්සන් නිෂ්පාදනයේ වැඩිවීම පිළිබිඹු කරමින් මත්ස්‍ය නිෂ්පාදන අංශයේ එකතු කළ වටිනාකම 1995 වර්ෂයේ දී සියයට 4.9 කින් වැඩි විය.

## පතල් හා කැනීම්

පතල් හා කැනීම් අංශයේ ප්‍රධාන කොටසකට දායක වන මැණික් පතල් කටයුතු, 1995 වර්ෂයේ දී පසුබෑමකට ලක්විය. කෙසේ වුවද, අනෙකුත් පතල් කටයුතු සතුටුදායක මට්ටමක පැවැතුණි. සමස්තයක් ලෙස මෙම අංශය 1995 දී සියයට 3.4 කින් වර්ධනය විය. වටිනා සහ අර්ධ වටිනා ගල් අපනයන ඉපැයීම් වි.ගැ.හි. අගය අනුව සියයට 7 කින් පහත වැටුණි.

## නිෂ්පාදන කර්මාන්ත

සැපයුම් අංශය ගත් කල, 1995 දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, කර්මාන්ත අංශය වෙතින්, මූලික වශයෙන් ම කම්හල් නිමැවුම් අංශයෙන්, ඇති විය. මෑත කාලයේ දී සිදුකල ආර්ථිකය ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවලින් කාර්මික අංශය සෘජු ඵල ලැබූ අතර, එයින් මෙම අංශය තුළ දැකිය හැකි වූ ගතිකභාවය ආර්ථික වර්ධන ක්‍රියාවලියට ආධාර කළා පමණක් නොව බාහිර සහ දේශීය වශයෙන් බලපෑ කම්පනයන්ට ඔරොත්තුදීමේ ශක්තිය ද ආර්ථිකයට ලබා දුන්නේය. පසුගිය වර්ෂයේ දී සියයට 8.8 ක අඩු වර්ධන වේගයක් පෙන්නුම් කළ කම්හල් නිමැවුම් අංශය 1995 දී සියයට 10.2 ක මූර්ත වර්ධන වේගයක් වාර්තා කරමින් මූර්ත දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට සියයට 28 ක දායකත්වයක් සැපයීය. මෙම වර්ධනය දේශීය වෙළෙඳපොළ මෙන්ම විදේශීය වෙළෙඳපොළ සඳහා යොමු වූ කටයුතු වල ද දැකිය හැකි විය. මූලික වශයෙන් කම්හල් නිමැවුම් අංශය වාර්තා කළ වර්ධනය හේතුවෙන් කර්මාන්ත අංශය සියයට 9 කින් වර්ධනය වී සමස්ත ආර්ථික වර්ධනයට සියයට 31 කින් දායක විය.

රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩය සියයට 14.8 කින් සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩය 10.9 කින් වර්ධනය වෙමින් 1995 දී කාර්මික නිෂ්පාදන වර්ධනය සඳහා සියයට 79 කින් දායක විය. පසුගිය වර්ෂයේ දී සියයට 9.1 කින් වර්ධනය වූ ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයේ නිමැවුම, 1995 වසරේ දී වර්ධනය වූයේ සියයට 6.6 කිනි. මෙම පහත වැටීමට හේතු වූයේ සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා ඛනිජ තෙල් සංස්ථාවේ පිරිපහදුව තාවකාලිකව වසා තිබීමය. පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදනය 1995 වසරේ දී සියයට 12 කින් වර්ධනය වූ අතර එම අංශය වර්ෂයේ මුළු කාර්මික නිෂ්පාදනයේ එකතු කළ අගයෙන් සියයට 91 කට දායක විය.

ප්‍රතිපත්ති අංශය සලකා බැලීමේදී, කලින් කලට සපයා ඇති සිත්ගන්නා සුළු බදු සහන සහ නිදහස් ප්‍රතිපත්තිමය රාමුවක් තුළ සපයා ඇති දිරිගැන්වීම් කාර්මික අංශයට උපකාරී වී ඇත. මේ සමගම රජය සතු ව්‍යවසායයන් ක්‍රමානුකූලව ප්‍රතිසංස්කරණය කිරීම නිසා පෞද්ගලික අංශය කාර්මික නිෂ්පාදන කටයුතු පිළිබඳ ගතික බලවේගය බවට පත්ව ඇත. සම්පත් බෙදීයාමේ විකෘතිතාවය ඉවත් කිරීම හා උද්ධමනය පහත හෙළීම අරමුණු කරගත් ආර්ථික කළමනාකරණය තුළින් සීඝ්‍ර කාර්මීකරණයකට හිතකරවූ සාර්ව ආර්ථික වාතාවරණයක වැදගත්කම 1995 නොවැම්බර් මස හඳුන්වාදුන් නව කාර්මීකරණ උපාය මාර්ගය තුළින් අවධාරණය කෙරුණි.

සුළු සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති සඳහා වන ණය යෝජනා ක්‍රමය (සුමක) යටතේ ජාතික සංවර්ධන බැංකුව මගින් සපයනු ලබන මධ්‍ය හා දිගුකාලීන ණය 1995 දී තවදුරටත් සැපයින. ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය ඒකාබද්ධව මෙම ණය ක්‍රමය සඳහා අරමුදල් සපයන ලදී. මෙයට අමතරව, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික සංවර්ධන බැංකුව සහ වාණිජ බැංකු විසින් කර්මාන්ත ආයතන සඳහා ණය වශයෙන් සහ ප්‍රාග්ධන සහභාගිත්වය තුළින් නොකඩවා සෘජු මූල්‍ය පහසුකම් සපයනු ලැබීය. කෙසේ වෙතත්, වසර අවසාන වන විට සංවර්ධන මූල්‍ය ආයතනවලට ලබාගත හැකිව තිබූ සම්පත් සම්පූර්ණයෙන් ම වාගේ ප්‍රයෝජනයට ගෙන තිබූ බැවින් එම ආයතන දෙක අමෙරිකානු ඩොලර් දශලක්ෂ 58 ක් වටිනා නව ණය අරමුදල් දෙකක් සඳහා එකඟතාවයකට පැමිණුනි. 1994 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ සියයට 6 ක වර්ධනය සමග සසඳන කල 1995 පළමු මාස නවය තුළ දී කාර්මික අංශයට සපයන ලද වාණිජ බැංකු අත්තිකාරම් සියයට 25 ක වර්ධනයක් පෙන්නුම් කරමින්, 1995 සැප්තැම්බර් අවසානයේ දී රුපියල් බිලියන 24 දක්වා ඉහළ ගියේය.

## ඉදිකිරීම්

මෑත අතීතයේ දී වේගයෙන් දියුණුවෙමින් පැවැති අංශයක් වූ ඉදිකිරීම් කටයුතුවල වර්ධනයෙහි යම් පමණක අඩුවීමක් 1995 දී දක්නට ලැබුණි. විදේශ ප්‍රාග්ධන ගලාඒම් පහත වැටීම, කර්මාන්ත හා සේවා අංශයන්හි ඉදිකිරීම් අඩුවීමට හේතු වූ අතර, තාවකාලික සිමෙන්ති හිඟය හා සිමෙන්ති මිල ඉහළ යාම, විශේෂයෙන් ම නිවාස ඉදිකිරීම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. රජය මගින් වෙන් කළ අරමුදල් වැඩිවීම හා එහි භාවිතය පිළිබිඹු කරමින් මාර්ග ඉදිකිරීම් කටයුතු නොකඩවා සිදු විය.

## සේවා

විදුලිබලය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා, ප්‍රවාහනය, ගබඩා කිරීම් හා සන්නිවේදන සේවා, තොග හා සිල්ලර වෙළෙඳාම, බැංකු පහසුකම්, රක්ෂණය හා නිශ්චල දේපල, නිවාස අයිතිය, රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව සහ වෙනත් සියලු සේවා අයත්වන සේවා

අංශය, සාමාන්‍යයෙන් අනිකුත් සීඝ්‍රයෙන් දියුණුවන රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද මෑත අතීතයේ දී සීඝ්‍රයෙන් දියුණු වූ අංශයක් විය. 1995 දී මෙම අංශය සියයට 5 කින් වර්ධනය වූ අතර, ආර්ථික වර්ධනයට සියයට 44 කින් දායක විය. 1995 දී මෙම අංශය වර්ධනය වූයේ සියයට 3.6 කින් පමණි. ඊට හේතු වූයේ නිර්යාත හා දේශීය වෙළෙඳපොළ ආශ්‍රිත වෙළෙඳාමේ එකතු කළ වඩා ඉහළ අගය, ආයාත ආශ්‍රිත වෙළෙඳාමෙහි එකතු කළ අගය සීඝ්‍ර ලෙස පහත වැටීම මගින් සමහන් වී යාමය. විදුලිබලය, ගෑස්, ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා අංශය සියයට 10.2 කින් වර්ධනය විය. සන්නිවේදන සේවා සියයට 14 කින් වර්ධනය වූ අතර එය ආර්ථිකයේ අතිශයින් ම ගතික අංශයක් බවට පත් විය. නිර්යාත ප්‍රමාණය හා අන්තර් නැව්බඩු ප්‍රවාහනයෙහි වැඩිවීම පිළිබිඹු කරමින් වරාය සේවා සියයට 7 කින් වර්ධනය විය.


නව මූල්‍ය උපකරණ හා නවීන පහසුකම් හඳුන්වා දෙමින් වාණිජ බැංකු ක්‍රමය ව්‍යාප්තවීම ද නව වාණිජ බැංකු විවෘත කිරීම ද ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්‍රමය පිළිබඳව වැඩිවෙමින් පවත්නා විශ්වාසය පෙන්විය. කොටස් වෙළෙඳපොළ කටයුතු පහත වැටී තිබුණු අතර තැරැව්කාර සමාගම්වල එකතු කළ අගය 1995 දී පහත වැටුනි. 1995 දී රක්ෂණ අංශය වඩාත් තරගකාරී හා ක්‍රියාශීලී බවට පත්විය.

## දළ දේශීය වියදම හා ඉතිරිකිරීම්

දළ දේශීය වියදම මගින් මනිනු ලබන සමස්ත ඉල්ලුම 1995 දී රුපියල් දශලක්ෂ 7,25,710 දක්වා සියයට 12 කින් වර්ධනය විය. පරිභෝජන වියදම සියයට 14කින් වර්ධනය වූ අතර ආයෝජන වියදම සියයට 6.3 කින් වර්ධනය විය. පෞද්ගලික පරිභෝජන වියදම සියයට 12.7 කින් වර්ධනය වූ අතර එය නාමික ආදායම් වර්ධනයට වඩා මදක් අඩු වර්ධන අනුපාතයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව

රූප සටහන 1.3

**සමස්ත ඉල්ලුම හා ඉතිරි කිරීම**



පාරිභෝගික වියදම් අනුපාතය සුළු වශයෙන් පහත වැටුණි. 1994 දී පැවැති සියයට 9.7 සමග සසඳන විට, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රජයේ පරිභෝජන වියදම් ප්‍රතිශතය සියයට 10.5 කින් වැඩි විය. භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ වියදම් හා ආරක්ෂණ වියදම් ඉහළ යාම මින් පිළිබිඹු වෙයි.

ඒ අතර, විදේශීය පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් අඩුවීම සහ කම්කරු නොසන්සුන්තාවත්, අවිනිශ්චිත ආරක්ෂක තත්ත්වය හා දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි අවනතිය නිසා ආයෝජන වාතාවරණයෙහි පසුබෑම ද හේතුවෙන් ආයෝජන ඉල්ලුම පහත වැටුණි. මෙක්සිකානු අර්බුදයට පසුව, විදේශ ප්‍රාග්ධනය දියුණුවන රටවල ප්‍රාග්ධන වෙළෙඳපොළවලින් ඉවතට ඇදී යෑම නිසා ඇති වූ විනිමය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ විචලතාව ද ශ්‍රී ලංකාව වෙත ගලා ආ විදේශීය ප්‍රාග්ධනය අඩුවීමට එක්තරා දුරකට බලපෑවේය. ජ්‍යාර් ලංකා සමාගම විසින් කරන ලද ගුවන්යානා මිල දී ගැනීම් අත්හල විට පෞද්ගලික ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ප්‍රතිශතාංක 1.2 කින් පහත වැටුණි. මෙම පහත වැටීම ප්‍රධාන වශයෙන්ම විදේශීය පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් අඩුවීමේ ප්‍රතිඵලයකි.

1995 දී විදේශීය ඉල්ලුම ශක්තිමත්ව පැවැතිණ. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන වි.ගැ.හි. අගය වශයෙන් සියයට 10 කින් ඉහළ ගිය අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස 1994 දී වූ සියයට 34 සිට 1995 දී සියයට 36 දක්වා ඉහළ නැගුණි.


1995 දී දේශීය ඉතිරිකිරීම් නාමික වශයෙන් සියයට 16 කින් ඉහළ ගියේය. ආර්ථිකයේ ඉතිරිකිරීම් පිළිබඳ සමස්ත දර්ශකය වශයෙන් සැලකෙන, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස දේශීය ඉතිරිකිරීම්, සියයට 15.5 ක් දක්වා ඉහළ ගියේය. පෞද්ගලික ප්‍රේෂණ සහ විදේශීය ආයෝජන ආදායම් ගලාඒම් සඳහා දේශීය ඉතිරිකිරීම් ගැලපීමෙන් ගණනය කරන ලද ජාතික ඉතිරිකිරීම් මට්ටම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1994 දී පැවැති සියයට 19.1 සිට 1995 දී සියයට 19.7 දක්වා ඉහළ නැගුනි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 5.3 ක් වූ පෞද්ගලික ප්‍රේෂණ, ජාතික ඉතිරිකිරීම් අනුපාතය, දේශීය ඉතිරිකිරීම් අනුපාතයට වඩා සැලකියයුතු අන්දමින් ඉහළ දැමීමට හේතු වූ බව සඳහන් කිරීම වැදගත්ය. එමනිසා, 1995 දී ආයෝජන මූල්‍යනය සඳහා විදේශීය ඉතිරිකිරීම් යොදාගැනීම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.2 ක් පමණ විය.

## මිල

1995 දී, සාමාන්‍ය ආර්ථික වර්ධන වේගයක් අත්කර ගත්තේ අඩු උද්ධමනීය වාතාවරණයකය. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට අනුව උද්ධමන අනුපාතිකය 1995 දී සියයට 7.7 දක්වා පහත වැටුණි. 1990 දී සියයට 21.5 ක උපරිම මට්ටමකට ඉහළ ගිය උද්ධමන අනුපාතිකය පසුගිය වසර 5 තුළ දී පහත වැටුන බවත්, 1987 න් පසුව පිළිවෙලින් වසර දෙකකදී උද්ධමන වේගය සියයට 10 ට අඩු මට්ටමක පැවැති වසර 1995 බවත් සැලකිල්ලට ගැනීම වටී. මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය සහ දළ ජාතික නිෂ්පාදිත ගම්‍ය මිල අවධමනකය වැනි වෙනත් සමස්ත මිල දර්ශක ද උද්ධමනයේ සැලකිය යුතු පහත වැටීමක් දැක්විය. මුදල් සැපයුම සැලකිය යුතු ලෙස ඉහළ යද්දීත්, සාමාන්‍ය වාර්ෂික උද්ධමන වේගය පහත වැටීමට හේතු

රූප සටහන 1.4

මිල වෙනස්වීම්




වූයේ, මූලික ආහාර වර්ග සැපැයුම වැඩිවීම, ආනයන තීරුබදු අඩු කිරීම, පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ ආයතනික රටාවේ වැඩිදියුණු කිරීම්, විශේෂයෙන් කාලීන මිල උච්චාවචනයන් සමනය කිරීමේ ලා රාජ්‍ය අංශයේ වෙළෙඳ ආයතන අනුගමනය කළ ක්‍රියාශීලී වෙළෙඳ ප්‍රතිපත්තිය සහ පාලිත මිල ගණන් පහත දැමීමෙන් යම් පමණකට ඇති වූ බලපෑමත්ය. 1994 අග භාගයේ දී ක්‍රියාත්මක කරන ලද තිරිඟු පිටි, පාන් සහ භූමිතෙල්වල මිල පහත දැමීම්, 1995 සමස්ත උද්ධමනය මත ද යම් තරමක බලපෑමක් නොකඩවා ඇති කළේය. යහපත් කාලගුණික තත්ත්වය නිසා වී, පොල් සහ එළවළු වැනි ඇතැම් ප්‍රධාන කෘෂිකාර්මික භාණ්ඩවල සැපයුම වැඩිවීම ද වෙළෙඳපොළෙහි හිඟයන් පැවැති කාලවලදී ප්‍රධාන ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම ද මිල මට්ටම් ඉහළ යාම සීමා කිරීමට බලපෑ අනිකුත් සාධකයන්ය. මෙම හේතු නිසා, වර්ෂය අග දී සාමාන්‍යයෙන් දක්නට ලැබෙන කාලීන මිල ඉහළ යාම් 1995 දී දක්නට ලැබුණේ මධ්‍යස්ථ ප්‍රමාණයකිනි. තිරිඟු පිටි සහනාධාරය ක්‍රමයෙන් අඩු කිරීම, වසරේ දෙවැනි භාගයේදී මිල ගණන්වල හැසිරීමට බලපෑවේය. 1994 දී පහත් උද්ධමන වේගයක් වාර්තා කළ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය පසුගිය වර්ෂයේ දෙසැම්බර් මාසයේ සිට 1995 දෙසැම්බර් මාසයට සියයට 11.5 කින් වැඩි විය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ හැසිරීම වර්ෂය තුළ දී, එක්තරා දුරකට යම් කාලීන රටාවක් පිළිබිඹු කළේය. කෘෂිකාර්මික නිෂ්පාදනයේ කාලීන රටාව අනුව යමින් මෙම දර්ශකය 1995 පෙබරවාරි-මාර්තු (මහ අස්වැන්න) සහ නැවත අගෝස්තු සැප්තැම්බර් (යල අස්වැන්න) මාසවල පහත වැටුණි. 1995 සැප්තැම්බර් මාසයේ සිට මිල ඉහළ ගිය

අතර මෙයට පසුගිය වසරේ සිදු කළ පාලන මිල අඩුකිරීම්වල බලපෑම් ක්‍රමයෙන් ඉවත්ව යෑම සහ තිරිඟු පිටි සහනාධාරය අඩුකිරීමද බලපෑවේය.


ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමේ මිල ගණන් වෙනස්වීම් මැනීමට යොදාගැනෙන තොග වෙළෙඳ මිල දර්ශකය 1994 දී සියයට 5.0 කින් වැඩි වූ අතර 1995 දී සියයට 8.9 ක් දක්වා වැඩි වෙමින් මිල මට්ටම වැඩිවීමේ වේගයෙහි ඉහළ යාමක් පෙන්විය. මින් පිළිබිඹු වූයේ, වර්ෂය තුළ ප්‍රධාන ආයාත හා නිර්යාත භාණ්ඩයන්හි මිල වැඩිවීම් කෙරෙහි මෙම දර්ශකය දැක්වූ වැඩි සංවේදීතාවයය. 1994 දී අඩු වර්ධනයක් පෙන්වූ තොග වෙළෙඳ දර්ශකයේ ලක්ෂිත වැඩිවීම, 1995 දී සියයට 17 ක් විය.

## වැටුප්

1995 දී, රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප්වල සැලකිය යුතු වැඩිවීම් ඇති විය. වැටුප් වෙනස්කිරීම් සාමාන්‍ය උද්ධමන අගය සඳහා ගැලපූ කල, බොහෝ අංශයන්හි සේවකයනට මූර්ත වශයෙන් ඉහළ වැටුප් ලැබුණි.

වර්ෂය තුළ දී සේවක කාණ්ඩ රැසක වැටුප් වැඩි කරනු ලැබිය. සංවිධිත පෞද්ගලික අංශයේ පඩිපාලක සභා බොහොමයක් ඔවුන්ගේ අවම වැටුප් ප්‍රතිශෝධනය කළේය. අසංවිධිත අංශයේ ගොඩනැගිලි ඉදිකිරීම් හා කුඩා ඉඩම් වගා යන අංශවල බොහෝ කටයුතු සඳහා නාමික වැටුප් උද්ධමන අනුපාතිකයට වඩා වැඩි අනුපාතයකින් ඉහළ යාමෙන් ඔවුන්ගේ මූර්ත වැටුප් ඉහළ නැංවින.

රූප සටහන 1.5
වැටුප් ප්‍රමාණ දර්ශක
(1990 = 100)




1995 දී රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යූහයේ වඩාත්ම සැලකිය යුතු වෙනස්කම වූයේ බොහෝ කලක සිට ම සංශෝධනය කළ යුතුව තිබූ රජයේ පාසල් ගුරුවරුන්ගේ වැටුප් 1995 ජනවාරි 01 සිට සැහෙන ප්‍රමාණයකින් වැඩි කිරීමය. වෙනත් බොහෝ ශ්‍රේණිවල ද වැටුප් තල ඉහළ නැංවීම ජනවාරියේ දී සිදු කෙරුණි. ඉංජිනේරු, පශු වෛද්‍ය හා කෘෂිකාර්මික සේවා වලට ප්‍රදානය කරන ලද අතුරු දීමනා වෙනත් සමාන්තර කළමනාකාර සේවාවන්ට ද ජූලි මාසයේ සිට ලබා දෙන ලදී. 1995 නොවැම්බර් සිට බලපාන පරිදි, තවත් වැටුප් ගැලපීම් කිහිපයක් කරනු ලැබිය.

ගුරු සේවා ක්‍රමය හඳුන්වා දීමත් සමග රජයේ ගුරුවරුන්ගේ වැටුප් තල සංශෝධනය කිරීම නිසා ඔවුන්ගේ නාමික වැටුප් සැලකිය යුතු අන්දමින් සියයට 27.7 කින් වැඩි විය. 1995 දී විධායක නොවන නිලධාරීන්ගේ වැටුප් සියයට 8.2 කින් වැඩි වූ අතර සුළු සේවකයන්ගේ වැටුප් සියයට 7.2 කින් වැඩි විය.

ක්‍රියාකාරීව පැවැති පඩිපාලක සභා 34 න් 22 ක්, මාසික අවම වැටුප් මට්ටම රු. 2,000 බවට පත් කිරීමේ අරමුණින් එම පඩිපාලක සභා යටතට ගැනෙන සේවාවල වැටුප් වැඩි කළේය. මෙම පියවරවලට අමතරව, 1994 දී එකඟ වූ සාමූහික ගිවිසුම් 20 ට සාපේක්ෂව, සාමූහික ගිවිසුම් 27 ක් පිළිබඳව 1995 දී එකඟතාවයකට එළඹුණි.


පඩිපාලක සභා යටතට එන සේවකයන්ගේ සමස්ත අවම වැටුප් අනුපාත දර්ශකය සියයට 3.8 කින් වැඩි විය. ජීවන වියදම් දීමනාවේ අත්හිටුවීම නිසා සමස්ත අවම වැටුප් දර්ශකවල ඉහළයාම තරමක් සීමා විය. කෘෂිකාර්මික කම්කරුවන්ගේ වැටුප් ඉහළ ගියේ සියයට 1.1 කින් පමණි. කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයන්ට 1995 දී සියයට 16.4 ක ඉහළ වැටුප් වර්ධනයක් ලැබුණි. සේවා අංශයේ සේවකයන්ට සියයට 5.9 ක වැටුප් වර්ධනයක් ලැබුණි.

## සේවා නියුක්තිය

දැනට ලැබී ඇති තොරතුරුවලට අනුව, 1995 දී උත්පාදනය කළ අතිරේක රැකියා අවස්ථා ඊට පෙර වසරේ රැකියා උත්පාදන මට්ටමට බොහෝදුරට සමාන බව පෙනේ. 1994 දී උත්පාදනය වූ නව රැකියා සංඛ්‍යාව 89,000 කි. ශ්‍රම වෙළෙඳපොළට අලුතින් එක්වූවන්ගෙන් සියයට 60 ක් පමණ අවශෝෂණය කර ගැනීමට ආර්ථිකයට හැකි බව ඇස්තමේන්තු කර තිබේ. 1995 උත්පාදනය වූ රැකියා ප්‍රමාණයෙන් තුනෙන් එකකට පමණ ආයෝජන මණ්ඩලය යටතේ එන ව්‍යවසායයන් දායක විය. දැනට ලැබී ඇති තොරතුරු අනුව, 1994 තුන්වන කාර්තුව අවසානයේ දී සියයට 13.7 ක්ව පැවැති සේවා වියුක්ති අනුපාතය 1995 එම කාර්තුව අවසානයේ දී සියයට 12.7 දක්වා පහත වැටී ඇත.

පෞද්ගලික සේවා, වෙළෙඳ සහ හෝටල් යන අංශ හැරුණු විට අනිකුත් සියලුම අංශ 1995 දී සේවා නියුක්තියේ වැඩිවීමට දායක විය. 1994 දී දක්නට ලැබුණු සේවා නියුක්තිය පහළ වැටීමට ප්‍රතිවිරුද්ධ අන්දමින් කෘෂිකර්මය, පශු සම්පත් හා ධීවර අංශයේ සේවා නියුක්තිය සියයට 7 කින් ඉහළ නැගුණි. 1994 දී දක්නට ලැබුණු සියයට 4 ක සාමාන්‍ය වර්ධනයට සාපේක්ෂව කාර්මික නිෂ්පාදන අංශයේ සේවා නියුක්තිය සියයට 12 කින් ඉහළ ගියේය.

විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් එතෙර යාම ශ්‍රම වෙළෙඳපොළෙහි සේවා වියුක්ති පීඩනය ලිහිල් කිරීම පිණිස තවදුරටත් උපකාරී විය. 1994 මට්ටමට වඩා සියයට 5.2 ක වර්ධනයක් පෙන්වමින්, සමස්ත වශයෙන් 1,70,000 ක් 1995 දී එතෙර රැකියා ලබා ගැනීමට සමත් වී යැයි ඇස්තමේන්තු කර ඇත. මෙයින් විශාල කොටසක්, එනම් සියයට 66 ක් පමණ නුපුහුණු කාන්තාවන්ය. සේවා නියුක්ති දත්ත මගින් පෙන්වන තවත් කරුණක් නම්, මැදපෙරදිග නොවන රටවල් එනම්, සිංගප්පූරුව, මාලදිවයින හා ඉතාලිය වැනි රටවලින් ඇති ඉල්ලුම, විශේෂයෙන් ගෘහසේවිකාවන් සඳහා ඉල්ලුම, ඉහළ යමින් පැවැති බවය. කෙසේ වුවද, මෑත කාලයේ දී වැටුප් හා වේතන වැඩි නොවීමේ තත්ත්වයක් යටතේ වුවත් මුළු රැකියා සඳහා පිටරට යැම්වලින් සියයට 92 ක්ම සිදුවූයේ මැදපෙරදිග රටවලටය. සිංගප්පූරුව හා දකුණු කොරියාව වැනි සීඝ්‍රයෙන් දියුණුවල ආසියාතු රටවල ද රැකියා අවස්ථාවන් ලබාගත හැකි විය.




රූප සටහන 1.6
සේවා වියුක්ති අනුපාතය

රැකියා අවස්ථා වැඩිකිරීමේ රජයේ අරමුණ අනුව යමින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික වාතාවරණය, රාජ්‍ය මූල්‍ය සානුබලයන්, නීතිමය රාමුව හා මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති රැකියා උත්පාදනයට වඩා හිතකරවීම සහතික කරනු වස් 1995 අග භාගයේ දී ජනාධිපති කාර්‍ය සාධක බලකායක් පිහිටුවනු ලැබිය.

## 1.3 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ අයවැය කටයුතු

1995 වර්ෂයේ අයවැය ක්‍රියාකාරිත්වය, රාජ්‍ය මූල්‍ය ස්ථායිතාවය පිළිබඳ සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළ ද, 1995 වර්ෂයේ අයවැය ඉලක්කයන්ට ළඟාවීමට නොහැකි විය. 1995 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය, 1995-1997 දක්වා වූ තෙවර්ෂ අයවැය රාමුවක් තුළ සම්පාදනය කරනු ලැබිය. ඒ අනුව වර්තන ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.6 ක අතිරික්තයක් බවට හැරවීම, සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.5 කින් අඩු කිරීම සහ අයවැය හිඟය මූල්‍යකරණය කිරීම සඳහා බැංකු අංශයෙන් අරමුදල් ලබා ගැනීම රුපියල් දශලක්ෂ 7,405 කින් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 1.1 කින් අඩු කිරීමත් තුළින් 1995 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවය නියුණු ලෙස අඩු කිරීමට බලාපොරොත්තු විය. 1995 වර්ෂයේ අයවැය සමග ප්‍රකාශයට පත් කළ මධ්‍යකාලීන අයවැය රාමුව මගින් රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයේ ව්‍යුහාත්මක දුර්වලතාවයන් නිවැරදි කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

රජය විසින් අයවැය හිඟය අඩුකර ගැනීම සඳහා අවශ්‍ය උපාය මාර්ග කිහිපයක් 1995 අයවැය ලේඛනය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් ආරක්ෂක වියදම් ඉහළ යන තත්ත්වයක් තුළ 1995 වර්ෂයේ අයවැය ඉලක්ක ළඟා කර ගැනීමට අසීරුතාවයක් පෙනීගිය අතර, මූලික අයවැය ඉලක්ක ශිලිහියාම අවම කිරීම සඳහා ආදායම් වැඩි කර ගැනීම සහ වියදම් විධිමත් කිරීම ඇතුළත් වූ ප්‍රතිපත්ති මාලාවක්, 1995 වර්ෂය මැද දී හඳුන්වා දීමට සිදු විය. මෙම නිවැරදි කිරීම් තුළ, ආරක්ෂක බද්ද සියයට 3.5 සිට 4.5 දක්වා වැඩි කිරීම, අමතර රුපියල් දශලක්ෂ 1,000 ක් ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන කඩිනම් කිරීම, ලංකා විදුලිබල මණ්ඩලය මත රුපියල් දශලක්ෂ 1,500 ක විශේෂ බද්දක් පැනවීම, සුඛෝපභෝගී භාණ්ඩ 10 ක් මත වූ නිෂ්පාදන බද්ද වැඩි කිරීම සහ ප්‍රමුඛස්ථ නොවන

සංඛ්‍යා සටහන 1.3


**රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සාරාංශය**

(ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස)

| | 1985 | 1990 | 1994 | 1995 තාවකාලික |
|---|---|---|---|---|
| මුළු ආදායම | 22.4 | 21.1 | 19.0 | 20.5 |
| වර්තන වියදම් | 20.1 | 22.3 | 21.9 | 22.1 |
| පොලී ගෙවීම් | 4.6 | 6.4 | 6.6 | 5.8 |
| වැටුප් හා වේතන | 4.2 | 4.9 | 5.1 | 5.5 |
| ආරක්ෂක | 0.3 | 0.7 | 1.9 | 1.8 |
| ආරක්ෂක නොවන | 3.9 | 4.1 | 3.1 | 3.7 |
| ආරක්ෂක (වේතන හැර) | 2.5 | 1.4 | 2.6 | 3.4 |
| විශ්‍රාම වැටුප් | 1.7 | 1.4 | 2.3 | 2.3 |
| ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් | 14.0 | 8.7 | 7.0 | 6.9 |
| වර්තන ගිණුමේ අතිරික්තය/ හිඟය (-) | 2.2 | -1.2 | -2.9 | -1.5 |
| අයවැය හිඟය (ප්‍රදානයන්ට පෙර) | -11.7 | -9.9 | -10.0 | -8.4 |
| අයවැය හිඟය ආරක්ෂක වියදම් හැර | -8.9 | -7.8 | -5.4 | -3.1 |
| ප්‍රාථමික අයවැය හිඟය | -7.1 | -3.5 | -3.4 | -2.6 |
| මූල්‍යකරණය | 11.7 | 9.9 | 10.0 | 8.4 |
| විදේශීය (ප්‍රදානයන් ඇතුළුව) | 6.4 | 5.7 | 3.5 | 3.3 |
| දේශීය | 5.3 | 4.2 | 6.5 | 5.1 |
| එයින් බැංකු | 2.9 | 0.1 | 0.2 | 1.1 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා වෙන් කළ වියදම් වලින් සියයට 10 ක් කපා හැරීම ඇතුළත් විය. මේ හේතුවෙන්, මුළු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1994 දී පැවැති සියයට 19.0 සිට 1995 දී සියයට 20.6 දක්වා ඉහළ ගියේය. මුළු වියදම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් පසුගිය වර්ෂයේ වූ සියයට 29 සමග සැසඳීමේ දී, සියයට 28.9 කට සීමා කර ගැනීමට හැකි විය. 1995 දී වර්තන ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 1.5 දක්වා ප්‍රතිශත ඒකක 1.4 කින් අඩු විය. ප්‍රදානයන් සඳහා ගැලපීමෙන් පසු සමස්ත හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 8.5 සිට සියයට 7 දක්වා අඩු විය. කෙසේ වෙතත්, රාජ්‍ය වියදම් අංශයේ ව්‍යුහාත්මක දුර්වලතා සහ විදේශීය ණය මෙන්ම රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිසංසකරණ මගින් ලැබෙන ආදායම් අපේක්ෂිත පරිදි නොලැබීම නිසා බැංකු ක්‍රමය වෙත ශුද්ධ ණය තුළින් ගත් ණය ආපසු ගෙවීමක් සඳහා වූ ඉලක්කය ළඟා කරගත නොහැකි විය. ඒ වෙනුවට, බැංකුවලින් ලබාගත් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,065 කින් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 1.1 කින් ඉහළ ගියේය.




රූප සටහන 1.7
රාජ්‍ය මූල්‍ය සමස්ත දැක්ම

වර්ෂයේ ප්‍රථම භාගය තුළ, රජයේ මූල්‍ය හිඟය බොහෝ දුරට බැංකු නොවන මූලාශ්‍ර මාර්ගයන්ගෙන් පියවා ගන්නා ලදී. රාජ්‍ය මූල්‍ය හිඟය පුළුල්වීම ආරම්භ වූයේ වර්ෂයේ දෙවන භාගයේදීය. මෙම කාලපරිච්ඡේදයේ දී ඉහළ ගිය රජයේ සම්පත් අවශ්‍යතාවය මූලදී ප්‍රධාන වශයෙන් දේශීය වෙළෙඳපොළ ණය ගැනීම් මාර්ගයෙන් සපුරා ගන්නා ලදී. මෙය තාවකාලික ද්‍රවශීලතා හිඟයක් කරා යොමු කරමින් ඉහළ හා බෙහෙවින් විචල්‍ය කෙටිකාලීන පොලී අනුපාතිකයනට මග පෑදීය. 1995 වර්ෂයේ අග භාගයේ දී බැංකු අංශයෙන් ලබාගත් ණය ප්‍රමාණය වැඩි කිරීමට රජයට සිදු විය. මෙය, පොළී අනුපාත මත වූ පීඩනය සහ පෞද්ගලික ආයෝජන ක්ෂණිකව ඉවතට තල්ලු වී යෑම අඩු කළ නමුත් මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළේය.

## රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ

රජය සතු ව්‍යවසායයන් පෞද්ගලික අංශයට පැවැරීමේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල ශ්‍රී ලංකාවේ ඇරඹුයේ 1980 දශකයේ අග භාගයේදීය. 1995 මාර්තු මාසයේ දී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය, පෞද්ගලික ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම (පර්ක්) නම් අලුතින් පිහිටුවන ලද ආයතනික ව්‍යුහයේ විෂය පථය යටතට පත් කරන ලදී. 1995 අයවැය අවශ්‍යතා සඳහා ඉලක්ක කළ රුපියල් දශලක්ෂ 4,000 ට සාපේක්ෂව, රුපියල් දශලක්ෂ 3,001 ක් (කොළඹ ගෑස් සමාගම රුපියල් දශලක්ෂ 1,998 ක්, ප්‍රාග්ධන සංවර්ධන හා ආයෝජන සමාගම රුපියල් දශලක්ෂ 371 ක්, වැවිලි සමාගම් රුපියල් දශලක්ෂ 595 ක්, අනෙකුත් රුපියල් දශලක්ෂ 37 ක්) ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල තුළින් උපයනු ලැබිය. තවද, පර්ක් ආයතනය වෙනත් රාජ්‍ය ව්‍යවසාය කිහිපයක් ප්‍රතිව්‍යුහගත කිරීම වර්ෂය තුළ දී ආරම්භ කළේය. 1980 දශකයේ අග භාගයේ සිට රාජ්‍ය ව්‍යවසාය 60 ක් පමණ පෞද්ගලික අංශයට පවරා හෝ විකුණා ඇති අතර 1995 අග වනවිට එමගින් රුපියල් දශලක්ෂ 15,650 ක් උපයා තිබුණි.

## 1.4 ජාත්‍යන්තර වාතාවරණය සහ විදේශ අංශයේ වර්ධනයන්

### ජාත්‍යන්තර වාතාවරණය

1995 වර්ෂය තුළ දී, විනිමය සහ ප්‍රාග්ධන වෙළෙඳපොළවල විචලතාවක් තිබියදීත්, ලෝක ආර්ථික වර්ධනය සතුටුදායක තත්ත්වයක පවත්වා ගැනීම, උද්ධමනය පාලනය කර ගැනීම සහ කාලීන මූර්ත පොළී අනුපාතික අඩුවීම නිසා ජාත්‍යන්තර වාතාවරණයෙහි සතුටුදායක සංවර්ධනයන් පැවැතුනි. කාර්මික රටවල උද්ධමන අනුපාතිකය සියයට 2.4 ක් වූ අතර මූර්ත නිමැවුම සියයට 2.1 කින් වර්ධනය විය. දියුණුවෙමින් පවත්නා රටවල් උද්ධමනය 1994 පැවැති සියයට 50 සිට 1995 දී සියයට 19.5 දක්වා වූ අඩුවීමකුත් සමග සියයට 5.8 ක සැලකිය යුතු ඉහළ සාමාන්‍ය වර්ධනයක් අත්කර ගත්තේය. විශේෂයෙන්ම ආසියානු රටවල සියයට 8.4 ක සාමාන්‍ය ඇස්තමේන්තුගත වර්ධනයක් සහ සියයට 11 ක සාමාන්‍ය උද්ධමනයක් සමග 1995 වර්ෂය තුළ ද යහපත් ආර්ථික ප්‍රගතියක් දක්නට ලැබුණි.

පෙර නොවූ පරිදි එ. ජ. ඩොලරයක වටිනාකම යෙන් 87 දක්වා පහත වැටීමෙන් වසරේ මුල් කාලයේ දී ඇති වූ විනිමය අනුපාතයන්ගේ ඉහළ විචලතාවය ජපානය සහ අනිකුත් රටවල මැදිහත්වීම නිසා සමනය විය. ජපානය සහ අමෙරිකා එක්සත් ජනපදය අතර ඇති වෙළෙඳ අසමතුලිතය පිළිබඳ ප්‍රශ්න විසඳා ගැනීමට යොමුවීමේ ප්‍රගතියක් දක්නට ලැබුණි. වර්ෂයේ මැද භාගය වන විට ප්‍රධාන ව්‍යවහාර මුදල් අතර, විශේෂයෙන්ම එ.ජ. ඩොලරය, ඩොයිෂ් මාර්ක් සහ ජපාන යෙන් අතර වූ විනිමය අනුපාතිකය ස්ථායි විය. ආසියානු ව්‍යවහාර මුදල් අතර, ඉන්දියානු රුපියලෙහි අගය අගෝස්තු මාසයෙන් පසු සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය.

ඒ අතර, තම රටවල මන්දගාමී ආර්ථික කටයුතු වේගවත් කිරීම සඳහා ජපානය සහ ජර්මනිය, වර්ෂය තුළ දී ඔවුන්ගේ වට්ටම් අනුපාත පහළ හෙළීය. ඒ අතර, 1995 වර්ෂය තුළ දී අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගයන් වූ එ.ජ. ඩොලර්, ප්‍රංශ ෆ්‍රෑන්ක් සහ රන් පවුම් යන ව්‍යවහාර මුදල් වර්ගයන්හි ලන්ඩන් අන්තර් බැංකු පිරිනැමුම් අනුපාතිකය ද (LIBOR) ඉහළ ගියේය.

ලෝක වෙළෙඳාම පෙර වර්ෂයේ වූ සියයට 9 ක වර්ධනයට පසුව 1995 වර්ෂය තුළ දී ආසන්න වශයෙන් සියයට 8.7 කින් නොකඩවා වර්ධනය විය. පෙර වර්ෂයේ දී මෙන්ම සංවර්ධනය වන රටවලින් කෙරෙන අපනයන සියයට 12 ක වර්ධන අනුපාතිකයක් පවත්වා ගැනීමට සමත් විය. කාර්මික රටවල ආනයන සහ අපනයන 1995 දී සියයට 7 කින් වර්ධනය විය. මේ අතරතුර, බොහොමයක් අත්‍යවශ්‍ය කෘෂිකාර්මික භාණ්ඩවල හිඟය සහ එම භාණ්ඩ සඳහා වූ ඉහළ ඉල්ලුම නිසා තීව්‍ර වූ එම භාණ්ඩවල ලෝක ඌනතාවය හේතුවෙන් ඒවායේ මිල ගණන්, විශේෂයෙන් ම තිරිඟු, හාල්, සීනි හා කිරි නිෂ්පාදන මිල ගණන්, සැලකිය යුතු ලෙස ඉහළ නැගුණි. කාර්මික භාණ්ඩ සහ ඉන්ධන නොවන ප්‍රාථමික භාණ්ඩවල එ.ජ. ඩොලර් වලින් ප්‍රකාශිත ලෝක වෙළෙඳපොළ මිල පිළිවෙලින් සියයට 10.2 කින් හා සියයට 8.5 කින් වැඩි විය. 1995 දී තෙල් මිල ද සියයට 9.5 කින් වැඩි විය. මේ තුළින් එක්තරා දුරකට පිළිබිඹු වූයේ 1995 වර්ෂයේදී එ.ජ. ඩොලරය අවප්‍රමාණය වීමේ බලපෑමය.

1995 ජනවාරි මුල් භාගයේ ආරම්භ කරන ලද ලෝක වෙළෙඳ සංවිධානය තුළින් ක්‍රියාත්මක කිරීමට නියමිත වූ අවසාන උරුගුවේ සාකච්ඡා වටයේ තීරණයන් ලෝක වෙළෙඳාමේ වර්ධනයට උපකාරී විය. අවම විකෘතතාවන් සහිතව සෑමට සමානව ක්‍රියාත්මක වන ලෝක වෙළෙඳ ක්‍රමයක් දෙසට තැබූ ප්‍රධාන පියවරක් ලෙස ලෝක වෙළෙඳ සංවිධානය සැලකිය හැකිය. එමගින්, සේවා, බුද්ධිමය දේපල හිමිකම, කෘෂිකාර්මික සහ රෙදිපිළි හා ඇඟළුම් ඇතුළු ජාත්‍යන්තර වෙළෙඳ අංශයන් සියල්ලම වාගේ බහුපාර්ශ්වීය වෙළෙඳ ක්‍රමයක් තුළට ගෙන එනු ලැබීය. විශාල වශයෙන් තීරුබදු කපාහැරීම්, බහුවිධ කෙදි ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන පංගු ක්‍රමය වසර 2005 වනවිට ක්‍රමිකව මුළුමනින්ම ඉවත් කිරීමේ සැලසුම ඇතුළු තීරුබදු නොවන බාධක ඉවත් කිරීම මගින් නුදුරු අනාගතයේ දී වඩා තරඟකාරී වෙළෙඳ වාතාවරණයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. යුරෝපා සංගමය ද එහි සාමාජික රටවල් අතර සියලුම ආර්ථික සම්බාධකයන් ඉවත් කිරීමේ අවසාන අරමුණ කරා නොකඩවා ඉදිරියට ගියේය. ආසියාන් (ASEAN) සහ සාර්ක් (SAARC) රටවල් ඇතුළත් කලාපීය වෙළෙඳ සංවිධාන ද තම සාමාජිකයන් අතර වෙළෙඳ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට කටයුතු කළහ.

දියුණුවන රටවල නැගී එන මූල්‍ය වෙළෙඳපොළ සම්බන්ධයෙන් ආරක්ෂණවාදී ආකල්පයක් ආයෝජකයන් තුළ ඇති කිරීම තුළින් 1994 අග භාගයේ දී ඇති වූ මෙක්සිකානු මූල්‍ය අර්බුදය අනෙකුත් දියුණුවන රටවල් කෙරෙහි ද බලපෑමක් ඇති කළේය. බොහෝ ආයෝජකයන් නැගීඑන මූල්‍ය වෙළෙඳපොළවල සිට යළි යුරෝපයේ සහ උතුරු අමෙරිකාවේ ස්ථාපිත වෙළෙඳපොළවල් වෙත යොමු විය.

ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීම් දිගටම කරගෙන යන ලද අතර, බොහෝ දියුණුවන රටවල වෙළෙඳ නිදහස්කරණයන් හා අනෙකුත් ව්‍යුහගත ප්‍රතිසංස්කරණයන් මෑත කාලයේ දී එම රටවල ආර්ථික ප්‍රගතිය ශක්තිමත් කිරීමට දායක විය. එහෙත්, විශාල රාජ්‍ය අයවැය හිඟයන් හා රාජ්‍ය මූල්‍ය ස්වරූපයේ මැදිහත්වීම් නිසා ඵලදායී ආයෝජනයන් ඉවතට තල්ලු වී යෑම බොහෝ රටවල ආර්ථික ප්‍රගතියට අහිතකර බලපෑමක් කළේය.

මේ අතරතුර ලෝකයේ ප්‍රධාන ආර්ථික වර්ධන මධ්‍යස්ථානයන් ලෙස ආසියාවේ වේගයෙන් වර්ධනය වෙමින් පවත්නා රටවල් තවදුරටත් පැවතුණි. චීනයේ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ආසන්න වශයෙන් සියයට 11 ක් වූ අතර, කොරියාව (සියයට 9.7), වියට්නාමය (සියයට 9.7), මැලේසියාව (සියයට 8.5) සහ තායිලන්තය (සියයට 8.4) යන රටවල් කලාපයේ වේගයෙන්ම දියුණුවන රටවල් අතර විය.


ජාත්‍යන්තර ආර්ථික වාතාවරණයෙහි ඇති වූ මෙම වෙනස්වීම් 1995 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතියට යහපත් මෙන්ම අයහපත් බලපෑම් ඇති කළේය. ඉහළ විදේශීය ඉල්ලුම කාර්මික සහ කෘෂිකාර්මික භාණ්ඩ සඳහා වූ හිතකර මිල ඉහළයාම් සඳහා මූලික විය. එහෙත්, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යාම පිළිබිඹු කරමින් වෙළෙඳ අනුපාතය ආන්තික වශයෙන් පහත වැටුණි.

## විදේශීය අංශයේ වර්ධනයන්

නොකඩවා වසර පහක් තිස්සේ අතිරික්තයක්ව පැවැති ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය, 1995 වසරේ දී වි.ගැ.හි. දශලක්ෂ 62 ක් වූ සමස්ත හිඟයක් බවට පත්විය. මෙය ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් පහත වැටීමෙහි ප්‍රතිඵලයක් විය. එසේ වුවද, අපනයනවල යහපත් ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබුණු බැවින් වෙළෙඳ හා ජංගම ගිණුම්වල හිඟයන් තියුණු ලෙස පහත වැටුණි. වඩා යහපත් වූ අපනයන ක්‍රියාකාරීත්වය සහ ආනයන වර්ධනයේ තියුණු පහත වැටීම සමග වෙළෙඳ හිඟය වි.ගැ.හි. මිලියන 168 කින් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.5 කින් සැලකිය යුතු ලෙස අඩු විය. වෙළෙඳ ගිණුමෙහි වූ මෙම වර්ධනයන් සමග සේවා ගිණුමෙහි දක්නට ලැබුණු සුළු අතිරික්තය සහ ශුද්ධ පෞද්ගලික සංක්‍රාමයන්ගෙන් ලත් ඉපැයීම් ඉහළ යාමත් නිසා ජංගම ගිණුමෙහි හිඟය 1994 දී වි.ගැ.හි. දශලක්ෂ 526 සිට 1995 දී වි.ගැ.හි. දශලක්ෂ 358 දක්වා පහත වැටුණි. ජංගම ගිණුමෙහි හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස, 1994 දී පැවැති සියයට 6.5 සිට 1995 දී සියයට 4.2 දක්වා පහත වැටුණි.

**රූප සටහන් 1.8**

**විදේශීය අංශයේ තෝරාගත් දර්ශක**




විදේශීය ඉල්ලුම ඉහළ යාම, බොහෝ කෘෂිකාර්මික භාණ්ඩ සහ සමහර කාර්මික භාණ්ඩ සඳහා වඩා යහපත් ජාත්‍යන්තර මිල ගණන් ලැබීම, විනිමය අනුපාතය අවප්‍රමාණය වීම සහ ප්‍රධාන වැවිලි බෝග සම්බන්ධයෙන් හිතකර දේශගුණික තත්ත්වයක් පැවැතීම ආදී සාධකයන්හි පිටුබලය ලත් අපනයන, 1995 වර්ෂයේ දී වි.ගැ.හි. වටිනාකම් අනුව සියයට 12 ක වර්ධන අනුපාතයක් වාර්තා කළේය. කෙසේ වුවද, ආනයන වර්ධන වේගය 1994 දී වූ සියයට 16 සිට 1995 දී සියයට 3 ක් දක්වා තියුණු ලෙස අඩු විය. විදේශීය පෞද්ගලික ආයෝජන හා බැඳුණු ආනයන අඩුවීමත්, කල්පවතින පරිභෝජන භාණ්ඩ ගෙන්වීම අඩුවීමත් මෙම පහත වැටීම සඳහා බලපෑ ප්‍රධාන සාධක විය. ප්‍රධාන කෘෂිකාර්මික අපනයන නිෂ්පාදිත සඳහා පැවැති මිල ඉහළයාම් වලට වැඩියෙන් ප්‍රධාන ආනයන භාණ්ඩයන්ගේ මිල ඉහළ යාම නිසා වෙළෙඳ අනුපාතය සියයට 1.3 කින් පහත වැටුණි.

පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් අඩුවීම නිසා ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1994 දී පැවැති මට්ටමෙන් බාගයක් දක්වා අඩු විය. 1995 දී නිල ප්‍රාග්ධන ගලාඒම් වි.ගැ.හි. දශලක්ෂ 32 කින් වැඩි විය. කොළඹ ගෑස් සමාගම පෞද්ගලිකරණයෙන් ලද ආදායම වශයෙන් වි.ගැ.හි. දශලක්ෂ 25 ක ප්‍රාග්ධන ගලාඒමක් විය. එසේ වුවද කම්කරු නොසන්සුන්තාවන් සහ අභ්‍යන්තර ආරක්ෂක තත්ත්වය පිළිබඳ අවිනිශ්චිතභාවය නිසා විදේශීය පෞද්ගලික ආයෝජකයින් සුපරික්ෂාකාරීවීමත්, විශාල ප්‍රාග්ධන ව්‍යාපෘතීන් නිමවීමත් හේතුවෙන් විදේශ සෘජු ආයෝජන සහ පෞද්ගලිකරණයෙන් ලද ආදායම 1994 මට්ටමින් තුනෙන් එකක් දක්වා අඩු විය. ප්‍රධාන වශයෙන්, එයාර්ලංකා සමාගමේ ගුවන්යානා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල මූල්‍යනය කිරීම අවසන්වීම සහ කෙටිකාලීන වෙළෙඳ ණය ප්‍රමාණයන්ගේ අඩුවීම නිසා පෞද්ගලික ණය ප්‍රාග්ධන ගලාඒම් ද අඩු විය.

මේ අතර, 1995 දී ප්‍රතිපත්තිමය අංශයෙන් යහපත් වර්ධනයන් කිහිපයක් ඇති විය. උපරිම ආනයන බදු අනුපාත අඩු කිරීම, ආනයන බදු කාණ්ඩ සංඛ්‍යාව තුනක් දක්වා අඩු කිරීම සහ අක්‍රමවත් ලෙස සිදු කළ ආනයන බදු නිදහස් කිරීම් ඉවත් කිරීම ආදී පියවරයන් මගින් ආනයන බදු ව්‍යුහය තවදුරටත් තාර්කික කිරීමට පියවර ගන්නා ලදී. විනිමය අනුපාතිකය බොහෝදුරට වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වූ අතර එමගින් ඊට අදාල මූලික සාර්ව ආර්ථික සාධක ද පිළිබිඹු විය. ජංගම ගිණුමේ සියළුම කටයුතු, සියළුම ප්‍රාග්ධන ගලාඒම්, ණය ආපසු ගෙවීම් සහ පිටරටවල ආයෝජන සඳහා කෙරෙන ඉල්ලීම් වෙන් වෙන් වශයෙන් ගෙන තීරණය කර ඒ සඳහා රුපියලේ නිදහස් පරිවර්තනතාව සහතික කිරීම මගින් විදේශ ගෙවුම් ක්‍රමයේ ක්‍රියාකාරිත්වයෙහි පැහැදිලි බව පවත්වා ගැනුණි.

නව රජය වඩා හොඳ ප්‍රතිපත්ති ඇතුලත් අළුත් සැකසුම් වැඩපිළිවෙලක් දියත් කිරීමට අදහස් කරන නිසා පුළුල් කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල මගින් තෙවන වසරේ දීමට අදහස් කළ දෙවන කොටස වූ විගැහි දශලක්ෂ 56 ප්‍රයෝජනයට නොගෙන 1995 පළමු කාර්තුවේදී අවසන් වීමට ඉඩ හැරි යේය. විදේශ අංශයේ ගනුදෙනුවලින් 1995 දී ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් වි.ගැ.හි. දශලක්ෂ 63 කින් අඩු විය. වර්ෂය අවසානයේ දී පැවැති වි.ගැ.හි. දශලක්ෂ 1,729 ක දළ විදේශ වත්කම්, 1996 සඳහා ඇස්තමේන්තු කරන ලද ආනයනයන්ගෙන් මාස 5.4 කට සරිලන ප්‍රමාණයක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය. භාණ්ඩ හා සේවා අපනයනවලින් ලත් ඉපැයීම්හි ප්‍රතිශතයක් වශයෙන් ණය සේවා ගෙවීම්, ඉකුත් වර්ෂයේ පැවැති සියයට 13.3 සිට සියයට 13.8 දක්වා සුළු වශයෙන් වැඩි විය.

වර්ෂය තුළ ප්‍රධාන විදේශ මුදල් වර්ග සමග පැවැති විනිමය අනුපාතිකයන්ගේ දැඩි විචල්‍යතාව සහ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂයේ හිඟය සහිත තත්ත්වයක් තුළ ශ්‍රී ලංකා රුපියල, විනිමය වෙළෙඳපොළ කටයුතු සඳහා මහ බැංකුව මැදිහත්වීමේ දී යොදා ගැනෙන එ.ජ. ඩොලරයට ප්‍රතිමුඛව සියයට 7.5 කින් ද, විශේෂ ගැනුම් හිමිකම්වලට ප්‍රතිමුඛව සියයට 9.5 කින් ද අවප්‍රමාණය විය. ලක්ෂ්‍යමය පදනම මත ගණන් බලන ලද සියයට 11.5 ක් වූ උද්ධමන වේගය, වෙළෙඳ හවුල්කරුවන් හා තරගකරුවන් සම්බන්ධයෙන් පැවැති උද්ධමන වේගය වූ සියයට 5.5 සමග සසඳා බලන විට, එ.ජ. ඩොලරයට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලෙහි නාමික විනිමය අනුපාතිකයේ අවප්‍රමාණය, වර්ෂය තුළ දී තරමක් දුරට සඵල විනිමය අනුපාතිකය ස්ථාවරව තබා ගැනීමටත්, දේශීය නිෂ්පාදනවල ජාත්‍යන්තර තරගකාරි බව පවත්වා ගැනීමටත් ප්‍රමාණවත් විය.

## සංචාරක ව්‍යාපාරය


1995 දී සංචාරක ව්‍යාපාරය දැඩි පසුබෑමකට ලක් විය. වසරේ තෙවන කාර්තුව අවසන් වන තෙක් සියයට 5 කින් වර්ධනය වූ සංචාරකයන්ගේ පැමිණීම හතරවන කාර්තුව තුළ දී සියයට 17 කින් පහත වැටුණි. වර්ෂය සමස්තයක් ලෙස ගත් කල සංචාරක පැමිණීම් සියයට 1 කින් අඩුවූ අතර සංචාරක ව්‍යාපාරයෙන් ලත් ඉපැයීම් සියයට 7 කින් පහත වැටුණි.

## 1.5 මූල්‍ය අංශයෙහි සංවර්ධනයන්

මූලික වශයෙන්, වර්ෂයේ දෙවන කාර්තුවේ දී පෞද්ගලික අංශයට දුන් බැංකු ණය වේගවත්ව වැඩිවීම නිසා 1995 දී මූල්‍ය ප්‍රසාරණය ඉහළ මට්ටමක පැවැතුණි. විදේශ ප්‍රාග්ධන ගලාඒම් තියුණු ලෙස අඩු වූ සහ දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි පසුබෑමක් පැවැති තත්ත්වයක් තුළ මෙය සිදු විය. රජය සහ රාජ්‍ය සංස්ථා බැංකු ණය ලබා ගැනීම කෙරෙහි වැඩි වශයෙන් යොමු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පුළුල් මුදල් සැපයුම ($M_2$) 1994 දී වාර්තාවූ සියයට 19.7 ක වර්ධනය හා සසඳන කළ 1995 දී සියයට 19.2 කින් ප්‍රසාරණය විය. මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 5.5 ක සමඟ සැසඳීමේදී මෙම මූල්‍ය වර්ධන අනුපාතිකය ඉහළ අනුපාතයකි. කෙසේ වෙතත්, පසුගිය වසරෙහි වූ සියයට 18.7 ක වර්ධන අනුපාතිකය සමග සැසඳීමේ දී, 1995 වර්ෂයෙහි පටු මුදල් සැපයුම සියයට 6.7 කින් පමණක් වර්ධනය වීම සැලකිල්ලට ගත යුතුය. ඉහළ මූර්ත පොළී අනුපාතිකයන් පවතින අවස්ථාවන්හි දී පොළී රහිත වත්කම්වල සිට පොළී උපයන වත්කම් වෙත මහජනයාගේ වත්කම් සංයුතියේ කෙරෙන මාරු කිරීම්, පටු මුදල් සැපයුමට ($M_1$) වඩා වැඩි වේගයකින් පුළුල් මුදල් සැපයුම ($M_2$) වැඩිවීමට මූලික වශයෙන් හේතු විය. තැන්පතු ඒකරාශි කිරීම සඳහා දරන ලද දැඩි ප්‍රයත්නයන් සහ වාණිජ බැංකු මගින් සැපයෙන නව මූල්‍ය උපකරණ හා සේවාවන් ගේ වැඩිදියුණු කිරීම සහ ජනප්‍රිය කරවීම මෙම ක්‍රියාවලියට දායක විය. පහත වැටුණු කොටස් වෙළෙඳපොළෙහි මහජනයා විසින් කර තිබූ ආයෝජන බැංකු අංශය වෙත මාරු කිරීම සහ පොළී අනුපාතික වැඩිවීමට ප්‍රතිචාර දැක්වීමේ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව දැක්වූ ප්‍රමාදය නිසා එහි නව තැන්පතු වර්ධනය අඩු වේගයකින් සිදුවීම ද මෙම මාරුවීමට හේතු විය.

සිය සංචිත අවම කර ගැනීම, වඩාත් තරගකාරි බැංකු කටයුතු සඳහා වූ වාතාවරණයක් තුළ නව තැන්පතු රාශිකරණය කිරීම සඳහා ඉතා තරගකාරි පිළිවෙත් අනුගමනය කිරීම සහ විදේශයන්හි පැවැති ශේෂ අඩුකර ගැනීම මගින් බැංකු විසින් පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ වැඩි වූ ණය ඉල්ලුම සපුරාලීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බැංකු අංශයේ ශුද්ධ දේශීය වත්කම් තියුණු ලෙස සියයට 27 කින් ඉහළ ගියේය. විදේශ ප්‍රාග්ධන ගලාඒම් හීන වී යෑම, ක්‍රියාකාරිත්වය හීන වූ කොටස් වෙළෙඳපොළෙන් ලබාගත හැකි අරමුදල් ප්‍රමාණය පහත වැටීම සහ වසරේ අවසානය වනවිට, එම කාලච්ඡේදයේ දී සාමාන්‍යයෙන් පවතින පිරිවැටුමට වඩා අඩු පිරිවැටුමක් පැවැතීම නිසා ව්‍යාපාරික ආයතනයනට මුහුණ පෑමට සිදු වූ ද්‍රවශීලතා ප්‍රශ්න හේතුකොට ගෙන පෞද්ගලික අංශයේ ණය ඉල්ලුම වැඩි විය. එසේ වුවත් පොළී අනුපාතික අධික ලෙස ඉහළ යමින් පවතිද්දීත්, 1994 දී පැවැති සියයට 17.7 වර්ධනයට සාපේක්ෂව, පෞද්ගලික

අංශයට දුන් බැංකු ණය ප්‍රමාණය 1995 දී සියයට 29.5 කින් වර්ධනය විය. ආරක්ෂක සහ සුභසාධන වියදම් වැඩිවීම හේතුකොට ගෙන, රාජ්‍ය මූල්‍ය හිඟය පුළුල්වීමෙන් 1995 අවසාන භාගයේ දී රජය බැංකු අංශයෙන් ගත් ණය ප්‍රමාණය වැඩිවීම, 1995 දක්නට ලැබුණු ණය ප්‍රසාරණය තවත් තීව්‍ර කළේය.



රූප සටහන 1.9
මූල්‍ය සමස්තයන්ගේ වෙනස්වීම
(ලක්ෂිත පදනම මත)

බැංකු ක්‍රමයෙන් රජයට සපයන ලද ණය වැඩිවීම මුළුමනින්ම පාහේ දක්නට ලැබුණේ 1995 දෙවැනි භාගයේදීය. රජය විසින් දේශීය සම්පත් විශාල වශයෙන් ලබා ගැනීමත් සමග, ආරක්ෂක සහ සුභසාධන වියදම් ඉහළ නැගීමේ අයහපත් මූල්‍ය ප්‍රතිවිපාක වසරේ දෙවන භාගයේ දී දක්නට ලැබුණේය. කෙසේ වෙතත්, 1995 අග භාගය වනවිට වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් ද්විතීයික වෙළෙඳපොළෙහි විකිණීම නිසා රජයට සැපයුනු වාණිජ බැංකු ණය සුළු වශයෙන් පහත වැටුණි. ඒ හේතුකොට ගෙන, මහ බැංකුව විසින් රජයට සැපයූ ශුද්ධ ණය රුපියල් දශලක්ෂ 7,662 ක් දක්වා ඉහළ ගිය ද, එසේ නොවූයේ නම් පොළී අනුපාතික තවදුරටත් ඉහළ යා හැකිව තිබුණි.


පසුගිය දෙවසර තුළ දක්නට ලැබුණු තියුණු පහත වැටීමට වෙනස් වෙමින් රාජ්‍ය සංස්ථාවලට දෙන ලද බැංකු ණය ප්‍රමාණය 1995 වසරේ දී රුපියල් දශලක්ෂ 3,364 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. ගබඩා පහසුකම් විනාශවීම නිසා ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් රුපියල් දශලක්ෂ 1,297 ණය ගැනීමත්, ලෝක වෙළෙඳපොළෙහි පිටි මිල සීඝ්‍ර ලෙස ඉහළයාම නිසා සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව විසින් රුපියල් දශලක්ෂ 644 ණය ගැනීමත් මෙයින් පිළිබිඹු විය.

ඉකුත් වසරේ දී මෙන් නොව ගෙවුම් ශේෂයේ සමස්ත හිඟයක් පැවැතීම නිසා විදේශීය අංශයෙන් මුදල් සැපයුම මත පීඩනයක් ඇති නොවිය. 1995 දී බැංකු ශුද්ධ විදේශ වත්කම්වල සියයට 3.2 ක සුළු වැඩිවීමක් දක්නට ලැබුණු අතර එය ද විනිමය අනුපාතිකය වෙනස්වීමේ ප්‍රතිඵලයකි. 1994 වසරේ දී සියයට 24.3 ක වැඩිවීම හා සැසඳීමේ දී, 1995 දී මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් සියයට 12.8 කින් වැඩි විය. ඒ අතර විදේශ වත්කම්වල අනුරූප වර්ධනයක් නොමැතිව අනේවාසික විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ස්වරූපයෙන් වූ විදේශීය වගකීම් වැඩිවීමෙන් වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් පහළ ගියේය.

විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සහ දේශීය මූල්‍ය වත්කම් අතර පොළී අනුපාතික පරතරය පුළුල් වීම හේතුකොට ගෙන, බැංකු විසින් අඩු ආකර්ශණීයත්වයක් සහිත විදේශ වත්කම්වල සිට වැඩි ආකර්ශණීයත්වයක් සහිත දේශීය වත්කම් කරා ඔවුන්ගේ වත්කම් මාරු කළහ. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක තුළ ඇති තැන්පතු සහ විදේශ බැංකුවල ඇති ශේෂයන්හි අඩුවීමක් පෙන්නුම් කරමින් වාණිජ බැංකුවල දළ විදේශ වත්කම් පහළ ගියේය.

1994 දී වාර්තා කළ සියයට 20.5 ක වර්ධනය හා සැසඳීමේ දී සංචිත මුදල් හෙවත් අධිබලැති මුදල් 1995 වසරේ දී සියයට 15.5 කින් වැඩි විය. මූලාශ්‍ර අනුව සලකා බැලීමේ දී, රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රසාරණය සංචිත මුදල් වර්ධනයට දායක විය. මෙය සංසරණයේ පවත්නා ව්‍යවහාර මුදල්වල වැඩිවීම සහ බැංකු තැන්පතු වැඩිවීමක් මගින් පිළිබිඹු විය. දෙසැම්බර් මාසය තුළ දී පමණක් සංචිත මුදල් වැඩිවීමෙන් සියයට හැටක් සිදු විය.

මුදලේ ආදායම් සංසරණ ප්‍රවේගය තවදුරටත් හීන වූයේ, උද්ධමන අපේක්ෂා අඩුවීමත්, බැංකු අංශයේ වත්කම්වල ආකර්ශණීයත්වය වැඩිවීමත් පිළිබිඹු කරමිනි. පසුගිය වසර කිහිපයේ දක්නට වූ ප්‍රවනතාවයට අනුව යමින් මුදල් ගුණකය 1995 දී 2.9 ට ආසන්නව ස්ථාවරව පැවැතිණ.



රූප සටහන 1.10
කාර්තුමය පොළී අනුපාතික

මහ බැංකුවට 1995 දී මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සිදු වූයේ පසුගිය වසර පහේ දී පැවැති වාතාවරණයට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වූ වාතාවරණයක් තුළය. විශාල වශයෙන් සිදු වූ ප්‍රාග්ධන ලැබීම් නිසා ශුද්ධ විදේශීය වත්කම් තියුණු ලෙස ඉහළ නැගීම පසුගිය වසර පහක කාලය තුළ දී මුදල් සැපයුම වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය. සමස්ත ගෙවුම් ශේෂ හිඟයක් පැවැතීම නිසා මෙය 1995 දී දක්නට නොලැබිණ. එබැවින් මෙම වර්ෂයේ දී මූල්‍ය ප්‍රසාරණයට අත්‍යවශ්‍යයෙන්ම හේතු වූයේ දේශීය ණය ඉහළ නැගීමය. එහෙයින් 1995 දී මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී මහ බැංකුව මුහුණ පෑ අභියෝගය වූයේ, දැරීමට නොහැකි තරම් ඉහළ මට්ටමක මූල්‍ය වර්ධනයකින් ඇතිවන අහිතකර ප්‍රතිවිපාක මගහැරීම සඳහා ණය මුදල් වර්ධනය පාලනය කරන අතර, ආර්ථික ක්‍රියාවලිය අඩපණ නොවන සේ ආර්ථිකයට අවශ්‍ය ප්‍රමාණයට ද්‍රවශීලතාවය ලැබෙන බවට ද වගබලා ගැනීමය. 1995 දී නොකඩවා දැඩි සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය. වර්ෂය පුරාම සියයට 15 ක ඉහළ සංචිත අනුපාතයක් පවත්වා ගනු ලැබිය. කෙසේ වෙතත්, ද්‍රවශීලතා හිඟය සහ ඉතා ඉහළ පොළී අනුපාතික නිසා ඵලදායී ආර්ථික ක්‍රියාවලිය අනිසි ලෙස පීඩනයට පත්වීම වැළැක්වීම පිණිස වර්ෂය අවසානයේ දී මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමෙන් සහ මූල්‍ය ආයතනයනට සීමිත ලෙස විදේශීය ණය ලබා ගැනීමට ඉඩදීමෙන් එතෙක් පැවැති දැඩි සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය යම් ප්‍රමාණයකට ලිහිල් කරන ලදී.

මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති උපකරණය ලෙස, බැංකුව සතුව තිබූ භාණ්ඩාගාර බිල්පත් සහ මහ බැංකු සුරැකුම්පත් යොදා ගනිමින් විවට වෙළෙඳපොළ කටයුතු මත මහ බැංකුව තවදුරටත් රඳා සිටියේය. ආර්ථිකයෙහි අතිරික්ත ද්‍රවශීලීතාවය ද උරා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, මහ බැංකුව අතැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1994 අවසානයේ දී පැවැති රුපියල් දශලක්ෂ 5,099 සිට 1995 මාර්තු මස අවසානයේ දී රුපියල් දශලක්ෂ 2,991 දක්වා පහත වැටුණි. මුදල් සැපයුමේ වර්ධනය සීමා කිරීම පිණිස දෙවැනි සහ තුන්වැනි කාර්තුවේ දී මහ බැංකුව විසින් තෙමස් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළේය. මෙම සුරැකුම්පත්වල ඵලදාව වර්ෂයකට සියයට 14.08–18.10 පරාසයක පැවැතුණි.

මුදල් සැපයුමෙහි වර්ධනය ඉහළ මට්ටමක පැවැතිය ද, විදේශීය ප්‍රාග්ධන ගලාඒම් අඩුවීම සහ අරමුදල් සඳහා වූ දේශීය ඉල්ලුම වැඩිවීම හේතුවෙන්, ද්‍රවශීලතා අරමුදල් හිඟයක් සහ ඊට අනුරූප පොළී අනුපාතික ඉහළ නැගීමක් වර්ෂය අවසාන කාලය වන විට දක්නට ලැබුණි. මුදල් ප්‍රවාහ ආශ්‍රිත ප්‍රශ්න නිසා රජයෙන් ණය සඳහා වැඩි ඉල්ලුමක් ඇති විය. විදේශ අරමුදල් ගලාඒම් අඩුවීම අඩු ක්‍රියාකාරීත්වයක් පැවැති කොටස් වෙළෙඳපොළෙන් අරමුදල් සපයා ගැනීමට ඇති හැකියාව පහත වැටීම, උද්ධමන අපේක්ෂාවන් සහ ව්‍යාපාරික අංශයෙහි මුදල් ප්‍රවාහ ප්‍රශ්න බැංකු ණය සඳහා පෞද්ගලික අංශයේ ඉල්ලුම ඉහළ නැංවීමට දායක විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් භාණ්ඩාගාර බිල්පත් ඵලදාව මාර්තු මාසයේ දී වූ සියයට 14.34 ක සිට දෙසැම්බර් මාසයේ දී සියයට 18.68 දක්වා වැඩි විය. ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොළී අනුපාත මාර්තු මාසයේ දී පැවැති සියයට 18–25 සිට, දෙසැම්බර් මාසය අවසානයේ දී සියයට 20–58 දක්වා ඉහළ නැගුණි. සමපේක්ෂණ හැසිරීමක් පිළිබිඹු කරමින් දෛනික ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි මුදල් අනුපාතිකයන්ගේ අසාමාන්‍ය විචලනයක් දක්නට ලැබුණි.

මුදල් වෙළෙඳපොළෙහි දැඩිබව ලිහිල් කිරීම අරමුණු කොටගෙන මහ බැංකුව ද්විතීයික වෙළෙඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමට මැදිහත් වූ අතර සිය සුරැකුම්පත් කල්පිරීමේ දී නැවත නිකුත් නොකිරීමට ද තීරණය කළේය. තවද නොවැම්බර් මාසයේ දී භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් පහසුකමක් ආරම්භ කරනු ලැබිය. මෙම පහසුකම මගින් එක් දින පදනමක් මත ද්‍රවශීලතාව සැපයීම මෙන්ම ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි සමපේක්ෂණ කටයුතු අධෛර්යමත් කිරීම ද අපේක්ෂිත විය. එයට අමතරව, මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ දී අය කරනු ලබන ප්‍රතිවට්ටම් අනුපාතිකය ද පහත හෙළනු ලැබිය. තවද, 1996 වසරේ ආරම්භයේ සිට ක්‍රියාත්මක වන පරිදි වාණිජ බැංකුවලට සිය ප්‍රාග්ධන සහ සංචිතයන්ගෙන් සියයට 5 ක් දක්වා විදේශීය රටවලින් ණය ලබා ගැනීමට අවසර දීමට දෙසැම්බර් මස අග දී මහ බැංකුව තීරණය කළේය. විදේශ ප්‍රාග්ධන ගනුදෙනු තවදුරටත් නිදහස් කිරීමේ ක්‍රියාවලියෙහි කොටසක් ලෙස මෙය සැලකුණි. බැංකු, සිය ගනුදෙනුකරුවන්ට සමපේක්ෂණ කටයුතු සඳහා ණය ලබාදීම අධෛර්යමත් කිරීම සඳහා ශිෂ්ට ප්‍රයෝග ද මහ බැංකුව විසින් භාවිතා කරන ලදී. මෙම ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, මුදල් වෙළෙඳපොළෙහි ස්ථායිතාව නැවත ඇති කෙරුණි. ඒ අතරම, වැඩි වූ ද්‍රවශීලතාවය ඉතා ඉහළ මට්ටමක පැවැති පොළී අනුපාත අඩුකරලීමට උපකාරී විය.

මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සාපේක්ෂ වශයෙන් ඉහළ, සියයට 15 ක මට්ටමක වර්ෂය මුළුල්ලේම පවත්වාගෙන යනු ලැබිය. දේශීය ණය ප්‍රසාරණය සීමා කිරීම සඳහා එතෙර ආයෝජනය කළ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු මත සියයට 5 ක සහනදායී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකයක් අඛණ්ඩව පවත්වා ගැනුණි. දුෂ්කරතාවයනට පත් මූල්‍ය සමාගම්වලින් අරමුදල් සඳහා කෙරුණු ඉල්ලීම් එකිනෙක වෙනම සලකා බලා පහසුකම් සැලසීම ඉතාම සීමිත වශයෙන් දිගටම කරගෙන ගියත්, මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල යටතේ අලුතින් ණය ලබාදීමෙන් මහ බැංකුව වැළකුණි.

ප්‍රධාන වශයෙන්, මහ බැංකු සුරැකුම්පත් කල්පිරීමේ දී නැවත නිකුත් නොකිරීම, රජයට මහ බැංකුවෙන් දෙන ලද තාවකාලික අත්තිකාරම් වැඩිවීම සහ මහ බැංකුවේ ලාභයෙන් රජය වෙත කළ පැවැරීම හේතුකොට ගෙන, ද්‍රවශීලතාවයේ සැලකිය යුතු

ලිහිල්වීමක් පිළිබිඹු කරමින්, 1995 මුල් කාලයේ දී කෙටිකාලීන පොළී අනුපාතික පහත වැටුණි. වසරේ දෙවන කාර්තුවේ සිට මෙම ප්‍රවණතාවය දැඩි ලෙස ප්‍රතිවිරුද්ධ දෙසට යොමු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1994 වසර අවසානයේ දී සියයට 19.43 සිට 1995 පෙබරවාරි මස දී සියයට 14.00 දක්වා අඩු වූ දොළොස් මාසික භාණ්ඩාගාර බිල්පත්වල සාමාන්‍ය ඵලදා අනුපාතිකය ඔක්තෝබර් මැද වනවිට ක්‍රමයෙන් සියයට 20.5 ක් වූ උපරිම මට්ටමකට ඉහළ නැගුණි. එයින් අනතුරුව, ඵලදා අනුපාතිකයන් සුළු වශයෙන් පහත වැටුණ නමුත් 1995 අවසානය දක්වා සියයට 18 කට ඉහළින් පැවැතුණි. ඒකෂණ මුදල් වෙළෙඳපොළෙහි පොළී අනුපාතික ද මෙම ප්‍රවණතාවයම අනුගමනය කළ අතර 1995 දෙවන කාර්තුවේ දී, අධික විචල්‍යතාවයක් පිළිබිඹු කළේය. මධ්‍යම සහ දීර්ඝකාලීන පොළී අනුපාතික ද වර්ෂය තුළ දී යම් උච්ඡාවචනයක් වාර්තා කළේය.

විදේශ ආයෝජකයින්ගේ සහභාගිත්වය අඩුවීමේ හේතුවෙන් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කටයුතු පසුබෑමකට ලක්වුණි. සිත් ගන්නා සුළු ඉහළ මූර්ත පොළී අනුපාතයන් ද කොටස් වෙළෙඳපොළෙහි සිට බැංකු වෙතට ආයෝජන යොමු කිරීමට හේතු විය. 1995 දී සමස්ත කොටස් මිල දර්ශකය සියයට 33 කින් පහළ වැටුණු අතර සංවේදී මිල දර්ශකය සියයට 31 කින් පහළ වැටුණි.

1995 වර්ෂය තුළ දී ණය තොරතුරු කාර්‍යාංශ පනත, බැංකු පනත, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත, මුදල් නීති පනත, ලියාපදිංචි කොටස් සහ සුරැකුම් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සංශෝධනය කරමින් මූල්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීමේ පියවරවල් තවදුරටත් ගනු ලැබිය. මෙම සංශෝධන තුළින් රජයේ සුරැකුම් සඳහා ද්විතීය වෙළෙඳපොළ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා නීතිමය රාමුවක් සපයා දීමත් රාජ්‍ය අංශයේ මූල්‍ය ආයතනවල කාර්‍යක්ෂමතාවය වර්ධනය කිරීමත්, මූල්‍ය අංශයේ පරිපාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමත් බලාපොරොත්තු වේ.

## 1.6 ප්‍රශ්ණ හා ගැටළු

ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයේ ප්‍රධානත්වය ගත් කාර්මික නිෂ්පාදන අංශයේ ගතිකභාවය ප්‍රශංසනීය වුවත්, මෙම අංශය වර්ෂය තුළදී පැවැති කම්කරු නොසන්සුන්තාවන්ගේ අහිතකර බලපෑමට ලක්විය. මෙම නොසන්සුන්තාවන්, රජයේ මැදිහත් වීමෙන් පසුව සමතයකට පත් කෙරිණ. කම්කරු ප්‍රඥප්ති යක ස්වරූපයෙන් සේවා තත්ත්වයන් හා කම්කරු අයිතීන් නීතිගත කිරීමට ප්‍රයත්නයක් දරණු ලැබූ අතර, මුළු මනින්ම වාගේ හදිසියේ පැන නැගුන වර්ජන රැසක බලපෑම නිසා සේවායෝජක හා ආයෝජක පිරිස් ඒ පිළිබඳව සැක පහල කළහ. ලෝක වෙළෙඳපලේ තරඟකාරිත්වය පවත්වා ගැනීමේ අවශ්‍යතාව සේව්‍ය සේවක දෙපක්ෂයම හොඳින් දන්නා හෙයින් ඔවුන් අතර අන්‍යොන්‍ය සහයෝගය වර්ධනය කිරීම ඉතා වැදගත්ය. විශාල සේවා වියුක්ත ශ්‍රම බලකායක් සිටින තත්ත්වයකදී ශ්‍රම වෙළෙඳපලේ වැඩි නම්‍යතාවයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව රජය සැලකිලිමත් විය යුතුය. වැටුප් වැඩිකිරීම් හා ඵලදා වර්ධනය සම්බන්ධ කිරීමේ අවශ්‍යතාව සියලුම පාර්ශ්වවයන් විසින් පිළිගැනීම, දැඩි තරඟකාරීත්වයට මුහුණ දෙන අපනයනාභිමුඛ කර්මාන්තයන්හි සියලු වැටුප් සම්බන්ධ සාකච්ඡාවල පදනම විය යුතුය.

විදේශීය ප්‍රාග්ධන ගලාඒම් අඩපණවීම ද කාර්මික අංශය වෙත සම්පත් ගලායාම කෙරෙහි බලපෑවේය. මේ සමගම කොටස් වෙළෙඳපොළ පිරිහීම නිසා පොළී අනුපාතිකයන් ඉහළ යද්දී වුවත් ව්‍යවසායකයන්ට වැඩි වැඩියෙන් බැංකු ණය වෙත යොමුවීමට සිදු විය. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම ද කාර්මික අංශයෙහි වර්ධනයට බාධාකාරී වූ තවත් සාධකයකි. මෙවැනි දුෂ්කරතාවන් සහිත තත්ත්වයක් යටතේ වුවත් කාර්මික අංශය 1995 දී පෙන්නුම් කළ, ගැටළුවලට මුහුණපෑමේ ශක්තිය ප්‍රශංසාත්මකය.

ඉහත දක්වන ලද, කාර්මික අංශය පොදුවේ මුහුණ පෑ ගැටළුවලට අමතරව ප්‍රධාන වශයෙන්ම ආනයනය කළ හා රට තුළට නීතිවිරෝධී අන්දමින් ගෙන ආ රෙදිපිළි වලින් වූ තරඟය හේතුකොට ගෙන දේශීය වෙළෙඳපොළ මත රඳා සිටින සමහර රෙදිපිළි නිෂ්පාදකයෝ දැඩි අලෙවි ප්‍රශ්නවලට මුහුණපෑහ. රෙදිපිළි සඳහා පැනවුණු ආනයන තීරුබද්ද 1993 දී පැවැති සියයට 100 ක සිට 1995 දී සියයට 35 දක්වා ක්‍රමානුකූලව අඩුකිරීම නිසා දේශීය රෙදිපිළි නිෂ්පාදකයන් භුක්ති විඳිනු ලැබූ ආරක්ෂණය අඩු විය. 1995 දී ප්‍රධාන රෙදිපිළි නිෂ්පාදකයින් හත් දෙනෙකුගේ නිෂ්පාදනය සියයට 17 කින් පහත වැටුණි. දේශීය රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ සේවා නියුක්තිය හා නිමැවුම පහළ වැටීම දැඩි ලෙස අවධානය යොමු කළ යුතු කරුණක් වන නමුදු නිෂ්පාදකයන්ට ඇතිවන පාඩුව වැඩි වූ තරඟකාරිත්වය නිසා පාරිභෝගිකයන්ට ඇතිවන වාසි සමග සැසඳිය යුතුය. තරඟකාරිත්වය ඉහළ යාම සම්පත් බෙදීයාමේ කාර්‍යක්ෂමතාව වැඩි කරන අතර, වියදම් පිරිමැසීමට හා නිමැවුම්වල තත්ත්වය ඉහළ දැමීමට ආයතන පොළඹවයි. ඇත්ත වශයෙන්ම විදේශීය වෙළෙඳපොළ අරමුණු කොටගත් වඩා කාර්‍යක්ෂම නිෂ්පාදකයෝ මෙම නව අභියෝගයනට සාර්ථකව මුහුණ දුන්හ. කෙසේ වුවද, රෙදිපිළි ආනයන සම්බන්ධව වරායේ දී හා ගුවන් තොටුපොළේ දී වඩාත් සූපරීක්ෂණය තුළින්, තරඟකාරී වාතාවරණයට ගැලපෙන පරිදි හැඩගැසීම සඳහා කල් අවශ්‍ය නිෂ්පාදකයන්ට රැ වරණයක් සැපයීමට පිළිවන. මේ අතර, නුදුරු අනාගතයේදී තවදුරටත් තීරුබදු කපා හැරීමට අපේක්ෂිත හෙයින්, දේශීය රෙදිපිළි කර්මාන්තය වැඩි ගතිකත්වයක් පෙන්වමින් නව තාක්ෂණයේ ආයෝජනය කර පිරිවැය අවම කර ගැනීම සහ තරඟකාරිත්වය වර්ධනය කර ගැනීම සඳහා උත්සාහ කළ යුතුය.

1995 ජනවාරි මාසයේ දී ලෝක වෙළෙඳ සංවිධානය ස්ථාපිත කිරීමත් සමගම බහුවිධ කෙඳි ගිවිසුම යටතේ දැනට පවතින සියලුම ද්විපාර්ශ්වික රෙදිපිළි ගිවිසුම්, රෙදිපිළි සඳහා ඇඟළුම් පිළිබඳ උරුගුවේ සාකච්ඡා වටය යටතට පත් කරනු ලැබිය. රෙදිපිළි සහ ඇඟළුම් බහුපාර්ශ්වීය වෙළෙඳ ක්‍රමයක්

යටතට ගෙන ඒමෙන් හා පංගු ක්‍රමය වසර දහයක් තුළ දී ක්‍රමිකව ඉවත් කිරීමෙන් වසර 2005 වනවිට රෙදිපිළි සහ ඇඟළුම් වෙළෙඳාම පූර්ණ වශයෙන් නිදහස් වෙළෙඳාමක් බවට පත් කිරීම සඳහා රෙදිපිළි සහ ඇඟළුම් ගිවිසුම මගින් වැඩපිළිවෙලක් සම්පාදනය කර ඇත. එමනිසා බහුවිධ කෙඳි ගිවිසුම යටතේ සැලසෙන පහසුකම් ක්‍රමිකව ඉවත් කිරීමත් සමග එළඹෙන දැඩි තරගකාරී තත්ත්වයට මුහුණදීම සඳහා ශ්‍රී ලංකාව සූදානම්ව සිටීම අතිශයින්ම වැදගත් කරුණකි.

කෘෂිකාර්මික අංශය ගත්කල, වැවිලි අංශය සම්බන්ධ ප්‍රතිපත්ති වඩා පැහැදිලි තත්ත්වයකට පත් වූ අතර එම අංශයෙහි කාර්යක්ෂමතාව වැඩිවීමේ සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණි. එනමුත්, වැවිලි අංශයෙන් බැහැර කෘෂිකර්මය එකිනෙකට බලපාන සාධක රැසක අහිතකර බලපෑමට ලක් විය. එක් අතකින් අතිවිශාල වී අස්වැන්න සහල් මිල පහත හෙළීය. මේ තත්ත්වය වඩාත් උග්‍ර වූයේ තිරිඟු පිටි සහනාධාරය, වී ගොවියනට අවාසිදායක වන අන්දමට සාපේක්ෂ මිල වෙනස් කිරීමට හේතු වූ හෙයිනි. මිල අඩු, තිරිඟු පිටි පදනම් වූ නිෂ්පාදන කරා පාරිභෝගික ඉල්ලුම විතැන් වීම සහල් මිල තවදුරටත් පහත වැටීමට හේතු විය. මෙය, සහතික මිලක් යටතේ වී මිල දී ගැනීමට වී අලෙවි මණ්ඩලය ඉදිරිපත් වීමේ අවශ්‍යතාව සාධාරණීකරණය කරන එක් කරුණකි. වී අලෙවි මණ්ඩලය 1995 දී මුළු වී නිෂ්පාදනයෙන් සියයට 10 ක් පමණ මිල දී ගත් නමුත් එය සතු තොග අලෙවි කිරීමට අපොහොසත්විය. එනිසා වී අලෙවි මණ්ඩලයේ වාණිජමය පැවැත්ම දැඩි අභියෝගයට ලක් විය. වී අලෙවි මණ්ඩලය දේශීය බැංකු ක්‍රමයට නොපියවූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 2 කට වඩා වැඩි විය.

සමහර කෘෂිකාර්මික භාණ්ඩ (අර්තාපල්, ලොකු ළූණු සහ මිරිස්) ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම තවදුරටත් පවත්වාගෙන යාම වෙළෙඳ ප්‍රතිපත්තියේ පැහැදිලි බව අඩු කිරීමට හේතු විය. ආනයන බලපත්‍ර පිළිබඳ අවශ්‍යතාවය ප්‍රමාණාත්මක ආනයන පාලන ක්‍රමයකි. එය පාරිභෝගිකයාට විශාල අවාසියක් ඇති කරන අතර වෙළෙඳපොළ කාර්යක්ෂමව ක්‍රියාත්මකවීමෙහිලා බාධකයකි. මීට අමතරව මෙම සීමා පැනවීම වෙළෙඳ හා තීරුබදු පිළිබඳ පොදු සම්මුතිය/ ලෝක වෙළෙඳ සංවිධානයේ (GATT / WTO) XVIII (ආ) වගන්තියේ දැක්වෙන ගෙවුම් ශේෂය සම්බන්ධ බැඳීම්වලින් නිදහස්වීමට බාධකයක් විය. බලපත් නිකුත් කිරීම වෙනුවට ගොවීනට අවශ්‍ය රැකවරණය සඳහා විචල්‍ය තීරුබදු ක්‍රමයක් යොදා ගතහැක. එමගින් බලපත්‍ර ක්‍රමය යටතේ ඇයහපත් අභිමතානුසාරී තීරණ ගැනීමට ඇති ඉඩකඩ වැළැක්විය හැකිය. මෙයට අමතරව, මෙම ක්ෂේත්‍රයෙහි පැහැදිලි වූත් ස්ථිර වූත් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, මෙම කෘෂිකාර්මික භාණ්ඩ ගබඩා කිරීමේ හා බෙදාහැරීම් කටයුතුවල පෞද්ගලික අංශයෙහි සහභාගිත්වය දිරිමත් කරනු ඇත.

බාහිර හා අභ්‍යන්තර කම්පනයන් හේතුවෙන් ඇතිවන විවිධ අභියෝගයන්ට මුහුණ දීමට ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති හැකියාව, ව්‍යුහාත්මක ගැලපීම් හා වර්ධනය සම්බන්ධ අත්දැකීම්වලින්, පැහැදිලි ලෙස පෙන්වා ඇත. පෞද්ගලික අංශය මූල්වූ ආර්ථික වර්ධනය දිරි ගැන්වීම සඳහා රජය විසින් පාලිත ආර්ථික ප්‍රතිපත්ති රාමුවක සිට වෙළඳපොළාභිමුඛ වර්ධන රටාවක් වෙත සංවර්ධන උපාය මාර්ගය වෙනස් කිරීම ඇතුළු ව්‍යුහාත්මක ගැලපුම් රැසක් ක්‍රියාත්මක කරණු ලැබීය. වෙළෙඳ හා ගෙවීම් ක්‍රමය නිදහස් කිරීම, රාජ්‍ය අයවැයෙහි ඇතුළත් වූ විශේෂණයකින් තොරව සැමට පොදුවේ සපයන සහනාධාර ඒවා අවශ්‍ය අයට පමණක් සීමා කිරීම, විනිමය හා පොළී අනුපාතික ද ඇතුළු සාපේක්ෂ මිල විකෘතතා නිවැරැදි කිරීම, විදේශ ආයෝජනවලට අදාල විධිවිධාන ලිහිල් කිරීම, ප්‍රධාන තීරුබදු ප්‍රතිසංස්කරණ, රජය සතු ව්‍යාපාර පෞද්ගලිකරණය සහ දේශීය වෙළෙඳපොළ පාලනයන් ඉවත් කිරීම මෙම ව්‍යුහාත්මක ගැලපීම්වල අන්තර්ගත විය. වෙළෙඳපොළ හිතවාදී වන පරිදි මෙම ප්‍රතිසංස්කරණ 1995 දී තවදුරටත් ශක්තිමත් කෙරිණ.

මෙම ප්‍රතිපත්තිමය සංස්කරණයන් ආර්ථිකයට බොහෝ ප්‍රතිලාභ අත්කර දුනි. මූලින්ම, මෙම ප්‍රතිසංස්කරණයන් හා සමගම, දේශීය ආයෝජන හා ඉතිරිකිරීම් අතර පරතරය පියවීම පිණිස විදේශීය ප්‍රාග්ධනය විශාල ලෙස ගලා ආවේය. දළ දේශීය නිෂ්පාදිතයේ ආයෝජන අනුපාතිකය 1970 දශකය මැද භාගයේ දී වූ සියයට 15 සිට, යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ මුල් කාලීන පරිශ්‍රමයේ උච්ඡාවස්ථාව වූ 1980 ගණන්වල මුල් භාගයේ දී සියයට 30 ඉක්මවා ඉහළ නැංවීමට ආර්ථිකයට හැකි විය. රටේ සේවා වියුක්තිය තියුණු ලෙස පහත වැටුනු අතර ප්‍රතිසංස්කරණවලට පෙර පහත් මට්ටමක රැඳී තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 5 ඉක්මවා සීග්‍රලෙස වැඩි විය. වර්ධනයේ ප්‍රතිලාභ ආර්ථිකයේ විවිධ අංශවලට ව්‍යාප්ත විය. ආර්ථිකයේ බොහෝ අංශයන්, විශේෂයෙන් නිෂ්පාදන හා සේවා අංශයන්, ගතිකත්වයක් දැක්විය.

කෙසේ වුවද, විදේශ ප්‍රාග්ධන ගලාඒම් සහ දේශීය බැංකු ණය ගැනීම් වැනි ප්‍රසාරණාත්මක වූ ක්‍රම මගින් රාජ්‍ය මූල්‍ය හිඟයන් පියවීම නිසා පළමු ආයෝජන පරිශ්‍රමය තුළින් පාරිභෝගිකයන්ට අත්වූ මූර්ත ප්‍රතිලාභ ඉතා ඉක්මණින් ක්ෂය වී ගියේය. 1980-82 කාලච්ඡේදයේ දී පැවැති සියයට 19 ක පමණ සාමාන්‍ය අයවැය හිඟය සහිත රාජ්‍ය මූල්‍යයෙහි තියුණු අසමතුලිතතාවය, මිල හා මූල්‍ය ස්ථායීතාවට තර්ජනයක් විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව ගණනය කරන ලද උද්ධමන අනුපාතිකයේ සාමාන්‍යය මෙම කාලය තුළ සියයට 18.3 ක් ව පැවැතුණි. ඉහළ උද්ධමනය සහ රජය මගින් දේශීය මූල්‍ය සම්පත් වැඩියෙන් භාවිතයට ගැනීමෙන් පෞද්ගලික ආයෝජන අධෛර්යමත්වීම තුළින් සංවර්ධන උපාය මාර්ගයට අහිතකර බලපෑමක් ඇති විය. වාණිජමය කොන්දේසි යටතේ විදේශ ණය ගැනීම් මගින් සංවර්ධන වියදම් කොටසක් මූල්‍යකරණය කිරීම නිසා, රටේ විදේශ අංශය ශක්තිමත් තත්ත්වයක පවත්වා ගැනීම ද දැඩි අභියෝගයක් බවට පත් විය. ඉහළ උද්ධමනය සහ ප්‍රාග්ධන ගලාඒම් නිසා විදේශ විනිමය අනුපාතිකය මූර්ත වශයෙන් ක්‍රමිකව ඉහළ ගියේය. විදේශ ණය වැඩි වීම සමග ණය සේවා අනුපාතිකය අනුව සහ විදේශීය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් මැනෙන ණය බර ඉහළ ගියේය. කෙසේ වුවද, ඊළඟ වර්ෂ කිහිපයේ දී, ප්‍රාග්ධන වියදම් කපා හැරීම ඇතුළත් වූ කෙටිකාලීන ස්ථායීකරණ වැඩපිළිවෙලක් මගින් උද්ධමනය පාලනය කරනු ලැබීය. එහෙත්, 1980 ගණන් මැද භාගය වනතුරුම ද්වි-අංකික උද්ධමන අනුපාතිකයක් පැවැතුණි.

උතුරේ ත්‍රස්තවාදී කණ්ඩායම් සමග ගැටුම් පැන නැගීම සමග ආර්ථික කළමනාකරණ ප්‍රශ්න යළි සංකීර්ණ බවට පත්විය. මෙය, ආරක්ෂණ වියදම්වල තියුණු ඉහළ යාමකට හේතු විය. කෙසේ වුවද, රටේ ව්‍යුහාත්මක ගැලපුම් ක්‍රියාදාමය නොකඩවා ඉදිරියට ගෙන යනු ලැබූ අතර එහි ප්‍රධාන අංග වූයේ පෞද්ගලීකරණය සඳහා වැඩි අවධාරණය, බදු ක්‍රමය තර්කානුකූල කිරීම, සඵල ආරක්ෂණය තවදුරටත් අඩු කිරීම අරමුණු කරගත් වෙළෙඳ ප්‍රතිමත්තිමය ප්‍රතිසංස්කරණයන් ඉදිරියට ගෙනයාම සහ දේශීය මූල්‍ය අංශයේ කාර්යක්ෂමතාව වැඩිකිරීම අරමුණු කරගත් ප්‍රතිසංස්කරණයන්ය. මේවායින් බොහෝ ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත හැකි විය.

මෙම ජයග්‍රහණයන් ළඟා කර ගත්තද, වේගයෙන් සංවර්ධනය වන ආර්ථිකයන් හා සසඳන කල ශ්‍රී ලංකාව සංවර්ධන ක්‍රියාවලියෙහි සැලකිය යුතු අන්දමින් පසුපසින් සිටී. ආර්ථික ප්‍රසාරණය වැඩි කරනු සඳහා ප්‍රාග්ධන සම්පාදන අනුපාතිකය ඉහළ නැංවීම ක්ෂණික අවශ්‍යතාවයක්ව පවතී. එසේ නොමැති වුවහොත් මානව සංවර්ධන ක්ෂේත්‍රයේ අතීතයේ දී ලබාගත් ජයග්‍රහණයන්ගේ පසු බෑමකට පවා ඉඩ ඇත. 1985 දී සියයට 23.8 ක්ව පැවැති දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ආයෝජනය, සම්පත් සීමාවන් හේතුකොට ගෙන 1989 දී සියයට 21.7 දක්වා පහත වැටුණි. එතැන් සිට මෙම අනුපාතිකය ක්‍රමිකව වැඩි වී 1995 දී සියයට 25 දක්වා ඉහළ නැගුණි. කෙසේ වෙතත්, මැදි හා දිගුකාලයේ දී සීඝ්‍ර ආර්ථික වර්ධනයක් සඳහා පදනම සැපයීමට මෙම ආයෝජන මට්ටම ප්‍රමාණවත් නොවේ. ඉහළ ආයෝජනයක් සඳහා රාජ්‍ය අංශය මගින් සැපයිය හැකි සම්පත් පිළිබඳව සීමාවකට රට පත්වී ඇති බවක් පෙනේ. එබැවින් අනාගතයේදී ආයෝජන වර්ධනයට පෞද්ගලික අංශයේ සහභාගිත්වය වැඩි කිරීම අවශ්‍යය.

මෑත අතීතයේ දී අයවැය හිඟය පාලනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය අංශය මගින් කරන ලද ගැලපීම් ප්‍රශංසා කටයුතු වුවත් අයවැය සම්පත්වල අරපිරිමැස්ම සඳහා මාවත් සෙවිය යුතුය. වැඩි වූ ආරක්ෂණ වියදම් මුළු ආර්ථිකයටම බලපෑ අතර රාජ්‍ය මූල්‍ය අංශය සලකන විට දේශීය හා විදේශීය ණය මට්ටම ක්‍රමානුකූලව ඉහළ යාමට අමතරව මෙම ගැලපුම් කෙරුණේ ප්‍රාග්ධන වියදම මතය. ණය ගැනීම්වලින් අයවැය හිඟයන් පියවීම විෂම චක්‍රයක් නිර්මාණය කර ඇති අතර, ඒ නිසා, දැඩි ණය පාශයකට හසුවීම වළක්වා ගැනීම සඳහා විකල්ප මාර්ග යුහුසුළුව සොයාගත යුතුව ඇත.

මුදල් සැපයුම මත ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරණ නිසාත් පෞද්ගලික අංශයේ ආයෝජන වළක්වන නිසාත් අයවැය හිඟය පියවීමට බැංකු ණය වෙත යොමුවීම යෝග්‍ය නොවේ. මූල්‍ය සමස්තයන්ගේ අධික වර්ධනය, මිල මට්ටමට ඍජු හා වක්‍රාකාරයෙන් බලපායි. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයෙහි දැනට පවත්නා සීමිත ධාරිතාව යටතේ, මුදල් සැපයුම එක්තරා මට්ටමකින් ඉහළට වැඩිවීමට ඉඩ හළහොත් එහි ප්‍රතිඵලය විය හැක්කේ ඉල්ලුම ඉහළ යාම හා සාමාන්‍ය මිල මට්ටම ඉහළ නැගීමය. නොකඩවා ඉහළ යන මූල්‍ය සැපයුමෙහි වඩාත් අහිතකර සහ ඇතැම්විට අනතුරුදායක විය හැකි ප්‍රතිවිපාකය නම් ආර්ථිකය තුළ උද්ධමන අපේක්ෂාවන් ඉහළ යාමෙන් මුදලෙහි සංසරණ ප්‍රවේගය වැඩි වීමය. එසේ වුවහොත් එය යළි පහත දැමීම පහසුවෙන් කළ හැකි නොවේ. මේ මූල්‍ය ප්‍රසාරණයෙහි ඍජු ප්‍රතිවිපාකයන්ය. එබැවින්, රජය මහ බැංකුවෙන් වැඩි වශයෙන් ණය ගැනීම අධෛර්යමත් කළ යුතුය.

ශ්‍රී ලංකාව වැනි ආනයන ඉහළ රටක, ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් උද්ධමනයට වක්‍රාකාරයෙන් ද බලපායි. සීමිත දේශීය නිෂ්පාදනයක් යටතේ මුදල් සැපයුම ප්‍රසාරණය සමස්ත ඉල්ලුම (මුදල් වියදම් කිරීම) ඉහළ නංවයි. එය ආයාත වැඩිවීමටත්, ගෙවුම් ශේෂ හිඟය වැඩි කිරීමටත්, එමගින් විදේශ විනිමය අනුපාතිකය මත පීඩනයක් ඇති කිරීමටත් හේතු වෙයි. එහෙත් අතිරේක ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් තරම් විදේශ විනිමය ශේෂයන් රට සතුව පවතින තාක් මූල්‍ය ප්‍රසාරණය හේතුවෙන් මිල කෙරෙහි ඇතිවන පීඩනය උද්ධමන අනුපාතිකයෙහි පිළිබිඹු නොවේ. විදේශ විනිමය සම්පත් ක්‍රමයෙන් ක්ෂය වී යෑම විනිමය අනුපාතිකය පීඩනයට ලක් කරන අතර අවසානයේ දී එහි තියුණු පහත වැටීමකට මග පාදයි. එවිට ආනයන මිල ඉහළ යන අතර සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාමකටත් ඒ හා සම්බන්ධ වූ වැටුප් වැඩිකිරීම සඳහා ඉල්ලීම් වලටත් හේතුවේ. ඉහළ යන ආනයන මිල හා වැටුප්, පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් ඇති කරයි. එය විනිමය අනුපාතිකය තවදුරටත් පිරිහීමටත් නිෂ්පාදක හා පාරිභෝගික සැලසුම් තුළ උද්ධමන අපේක්ෂාවන් ස්ථාපිත වීමටත් මග පාදයි. මෙම චක්‍රීය සිදුවීම් තවත් දහර උද්ධමනයක ඇරඹුම විය හැක.

අතිකුත් බොහෝ සංවර්ධනය වන රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද, මිල වෙනස්වීම් කෙරෙහි සැපයුමේ කාලීන උච්චාවචනයන්, ගබඩා කිරීමේ හා ප්‍රවාහන දුෂ්කරතා, ශ්‍රම වෙළෙඳපොළෙහි අනම්‍යභාවය හා ආනයනික උද්ධමනය වැනි ව්‍යුහාත්මක හේතු නිසා ඇතිවිය හැකිය. ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති මෙම මිල ඉහළයාම් තවදුරටත් උග්‍ර කරයි. එසේ වුවද, විශාල අයවැය හිඟයක් වැනි වෙනත් සාර්ව ආර්ථික අසමතුලිතතාවන් පවතින අවස්ථාවක උද්ධමනය ඉතා පහත් මට්ටමකට අඩු කිරීම කළ නොහැකි මෙන්ම කිරීමට නුසුදුසු දෙයක් ද විය හැකිය. ඊට හේතුව එවැනි ප්‍රයත්නයකින් ආර්ථිකය පසුබෑමක් කරා යොමුවිය හැකි බැවිනි. එම නිසා, උද්ධමනයේ ක්‍රමානුකූල අඩුවීමක් ඉලක්ක කළ යුතු අතර, එය ව්‍යුහාත්මක අසමතුලිතතාවන් නිවැරැදි කිරීමේ ක්‍රියාවලියක් සමඟම කළ යුතුය.

මැදිකාලීන අයවැය කළමනාකරණයේ දී, රජය මගින් එක් අතකින් ආරක්ෂාව සැපයීම, අත්‍යවශ්‍ය හා මූලික අවශ්‍යතා සැපයීම යන සම්ප්‍රදායික කාර්යභාරයන් සහ අනෙක් අතට ආර්ථික වර්ධනය ඉහළ නැංවීම අතර සුදුසු සමතුලිතතාවයක් පවත්වා ගැනීමේ මූලික අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. මෙහිදී, යටිතල පහසුකම් දියුණු කිරීම ද ඇතුළු පෞද්ගලික අංශයට කාර්යක්ෂමව කළ හැකි සියලුම ආර්ථික කටයුතු කිරීමට එම අංශයට ඉඩ දිය යුතු අතර ඒවායේ පාලනය පිළිබඳව රජයේ මැදිහත් වීම හැකි තරම් අවම මට්ටමක පවත්වා ගත යුතුය. මෙය සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට ද, ආයෝජනය සීඝ්‍රයෙන් ඉහළ නැංවීමට ද, උද්ධමනකාරී නොවන ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට ද ඉවහල් වන්නා වූ ශක්තිමත් හා නිරසාර පදනමක් ලබාදෙනු ඇත.